4
ශ්‍රේණිය

මූලික පිරිවෙන්

# පාලි භාෂාව

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

## Mid Term and Year End Papers


**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් පාලි භාෂාව මධ්‍ය හා අවසන් වාර පසුගිය ප්‍රශ්න පත්‍ර

# පාලි

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Term Test - 2018

04 වසර / Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පාලි
**PALI**

කාලය : පැය තුන යි
Time : Three Hours

❖ **I** කොටසටත් **II** කොටසින් 02, 03 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

**01.** අංක 1 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

01. බාලාවතාර නම් පාලි ග්‍රන්ථය අයත් වන ව්‍යාකරණ සම්ප්‍රදාය වනුයේ

i. මොග්ගල්ලායන සම්ප්‍රදායට ය. ii. කච්චායන සම්ප්‍රදායට ය.
iii. සද්දනීති සම්ප්‍රදායට ය. iv. ථෙරවාද සම්ප්‍රදායට ය.

02. මොග්ගල්ලායන සම්ප්‍රදායට අනුව පාලි වර්ණ මාලාවේ අක්ෂර ගණන කීය ද?

i. 41 ii. 43 iii. 33 iv. 49

03. 'තත්‍රෝදන්තා සරා අට්ඨ' යන බාලාවතාර සූත්‍රයෙන් ඉගැන්වෙනුයේ

i. හ්‍රස්ව ස්වර පිළිබඳව ය. ii. දීර්ඝ ස්වර පිළිබඳව ය.
iii. සංයුක්ත ස්වර පිළිබඳව ය. iv. ස්වර අකුරු පිළිබඳව ය.

04. අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වරණය වනුයේ මින් කවරක් ද?

i. පුරිසධම්මසාරථී, බබ්බුව, පදට්ඨාන, චත්තාළීස ii. පුරිසදම්මසාරථී, බහුව, පදට්ඨාන, චත්තාළීස
iii. පුරිසධම්මසාරථී, බබ්බුව, පදට්ටාන, චත්තාළීස iv. පුරිසදම්මසාරථී, බහුව, පදට්ඨාන, චත්තාළීස

05. අකාරාදි පිළිවෙළ නිවැරදි ව ගලපා ඇති වරණය වනුයේ මේ අතරින් කවරක් ද?

i. අනරියො, අට්ඨ, අච්චුතං, අකාලිකො ii. අකාලිකො, අච්චුතං, අට්ඨ, අනරියො
iii. අකාලිකො, අනරියො, අට්ඨ, අච්චුතං iv. අච්චුතං, අනරියො, අට්ඨ, අකාලිකො

06. 'සාමණෙරො <u>පරිවෙණෙ</u> උග්ගණ්හාති' මෙම වාක්‍යයේ ඉරි ඇඳි පදයේ විභක්තිය වනුයේ

i. සත්තමී ii. දුතියා iii. පඤ්චමී iv. පඨමා

07. නපුංසක ලිංග ශබ්ද පමණක් ඇති වරණය වනුයේ

i. අග්ගි, දණ්ඩි, පුප්ඵ, ඵල, ධනු ii. පුප්ඵ, ඵල, ධනු, චිත්ත, පාප
iii. කට, ඝට, යට්ඨි, අග්ගි, දණ්ඩි iv. නදී, ජම්බු, පුප්ඵ, ඵල, පාප

08. වෙන්වීම් අර්ථය ප්‍රකාශ කරන විභක්තිය

i. කරණ නම් වේ. ii. පඤ්චමී නම් වේ. iii. ඡට්ඨී නම් වේ. iv. සත්තමී නම් වේ

09. සර්ව නාම යනු
i. කිසිඳු ලිංග භේදයක් නැති අලිංගික පදයි.
ii. ස්ත්‍රී ලිංගයේ හා පුරුෂ ලිංගයේ පමණක් යෙදෙන පදයි.
iii. ලිංගත්‍රයේ ම යෙදෙන පදයි.
iv. ලිංගත්‍රයේ ම නොයෙදෙන පදයි.

10. ආඛ්‍යාත පද සම්බන්ධයෙන් වඩාත් නිවැරැදි ප්‍රකාශය වනුයේ
i. කාලත්‍රයක්, පුරුෂත්‍රයක් හා කාරකත්‍රයක් ඇති පද වේ.
ii. කාලත්‍රයක් හා පුරුෂත්‍රයක් පමණක් ඇති පද වේ.
iii. ශබ්ද ප්‍රකෘතියට විභක්ති ප්‍රත්‍යය එක්වීමෙන් සෑදෙන පද වේ.
iv. කාලත්‍රයක් ඇති ලිංග භජනය කරන පද වේ.

11. 'ගච්ඡති' යන ක්‍රියා පදයේ ධාතුව කුමක් ද?
i. ගච්ඡ ii. ගච් iii. ගමු iv. ගච

12. අතීත කාලයට අයත් නොවන ආඛ්‍යාතයක් වනුයේ
i. පරොක්ඛා ii. අජ්ජතනී iii. සත්තමී iv. කාලාතිපත්ති

13. 'පචති' යන ක්‍රියා පදයේ වර්තමාන කාල, පරස්සපද, උත්තම පුරිස බහුවචන රූපය වනුයේ
i. පචසි ii. පචථ iii. පචාමි iv. පචාම

14. අනුමත කිරීම හා අණ කිරීම යන අර්ථ දෙකේ යෙදෙන ආඛ්‍යාත යුගලය වනුයේ
A. අජ්ජතනී B. සත්තමී C. පරොක්ඛා D. භවිස්සති E. පඤ්චමී
i. A හා B ii. B හා C iii. B හා E iv. D හා E

15. 'වත' යන නිපාතයේ අර්ථය කුමක් ද?
i. ඒකාන්තයෙන් ii. ඉදින් iii. හාත්පස iv. නිතර

16. 'වැඩි කලක් යන්නට පෙර' යන අර්ථය දෙන නිපාතය කුමක් ද?
i. අද්ධා ii. අභික්ඛණං iii. අචිරං iv. ආරා

17. 'ගුණවන්තු' ශබ්දය මෙන් වරනැඟෙන තවත් ශබ්දයක් වනුයේ
i. චින්තා ii. සීලවන්තු iii. ජන්තු iv. සබ්බ

18. පාටලීපුත්‍ර නගරය සම්බන්ධ ඓතිහාසික ශාසනික සිද්ධියක් වනුයේ
i. පළමු ධර්මසංගායනාව පැවැත්වීම යි.
ii. දෙවන ධර්මසංගායනාව පැවැත්වීම යි.
iii. තෙවන ධර්මසංගායනාව පැවැත්වීම යි.
iv. සිව්වන ධර්මසංගායනාවපැවැත්වීම යි.

19. 'ළන්තාඤ්ඤෙ ඝොසා' යන බාලාවතාර සූත්‍රයේ අර්ථය වනුයේ
i. 'ළ හැර ඉතිරි ඒවා ඝෝෂ වේ' යන්නයි.
ii. 'ළ අන්ත කොට ඇති ඉතිරි අකුරු ඝෝෂ වේ' යන්නයි.
iii. 'අන්තයේ ඇති ළ ඝෝෂ' වන බවයි.
iv. 'ළ අකුරු ඝෝෂවලට අයත් නො වේ' යන්නයි.
v.

20. 1932 පාලි ක්‍රමයට නිවැරැදිව ලියා ඇති වරණය කුමක් ද?

i. එකසහස්සාධිකනවසතද්වත්තිංසං
ii. ද්වත්තිංසනවඑකසහස්සං
iii. ද්වත්තිංසාධිකනවසතුත්තරසහස්සං
iv. සහස්සාධිකනවසතුත්තරද්වත්තිංසං

(ලකුණු 2 × 20 = 40 යි)

## II කොටස

**02.** (අ). පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එකස්මිං සමයෙ සත්ථා ගණං පහාය එකෙකොව එකං වනං පාවිසි. පාරිලෙය්‍යකො නාම එකො හත්ථිරාජාපි හත්ථිගණං පහාය තං වනං පවිසිත්වා. භගවන්තං එකස්ස රුක්ඛස්ස මූලෙ නිසින්නං දිස්වා පාදෙන පහරන්තො රුක්ඛමූලං සොධෙත්වා සොණ්ඩාය සාඛං ගහෙත්වා සම්මජ්ජි. තතො පට්ඨාය දිවසෙ දිවසෙ සොණ්ඩාය ඝටං ගහෙත්වා පානීය පරිභොජනීය උදකං ආහරන්ති. උණ්හොදකෙන අත්ථෙ සති උණ්හොදකං පටියාදෙති. කථං ? කට්ඨානි සංඝිත්වා අග්ගිං පාතෙති. තත්ථ දාරූනි පක්ඛිපන්තො ජාලෙත්වා තත්ථ තත්ථ පාසාණෙ පචිත්වා දාරුකණ්ඩකෙන පවට්ටෙත්වා බුද්දකසොණ්ඩියං ඛිපති, තතො හත්ථං ඔතාරෙත්වා උදකස්ස තත්තභාවං ජානිත්වා ගන්ත්වා සත්ථාරං වන්දති.

(ලකුණු = 9 යි)

(ආ). පහත් සඳහන් ගාථා සිංහලට නගන්න.

ගොචරාය ගතෙ සීහෙ - දක්ඛිණංසම්හි මාතරං,
වාමෙ කනිට්ඨිං කත්වාන - තතො සිසං අපක්කමි.

නිවාසෙත්වාන සාඛං තෙ - පච්චන්තං ගාම'මාගමුං,
තත්ථා'සි රාජධීතාය - මාතුලස්ස සුතො තදා.

සෙනාපති වංගරඤ්ඤො - ඨිතො පච්චන්තගාමකෙ,
නිසින්නො වටමූලෙ සො - කම්මන්තං සංවිධාපයං.

(ලකුණු 2 x 3 = 6 යි)

**03.** (අ) පාලියට නගන්න.

i. උදෑසන නැගිට සාමණේරයන් වහන්සේලා බුදුන් වඳිති.
ii. සුදොවුන් මහජතුමා කිඹුල්වත් පුරයේ වාසය කළේය.
iii. සිල්වත් භික්ෂුව සෑ මළුව හොඳින් අමදියි.

(ලකුණු 3 x 3 = 9 යි)

ආ. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අම්හාකං භගවති පරිනිබ්බුතෙ පාටලිපුත්තසමීපෙ අඤ්ඤතරස්මිං ගාමෙ අඤ්ඤතරො දුග්ගතමනුස්සො වසති. සො පනෙකදිවසං අඤ්ඤතරං ගාමං ගච්ඡන්තො ද්වෙ සාටකෙ නිවාසෙත්වා මහන්තං අටවිං පාපුණි. තදෙවං ගච්ඡන්තං දිස්වා එතස්ස වත්ථං ගණ්හිස්සාමී'ති එකො චොරො අනුබන්ධි. සො දූරතොව ආගච්ඡන්තං චොරං දිස්වා චින්තෙසි. අහමෙතස්මා පලායිතුං වා තෙන සද්ධිං යුජ්ඣිතුං වා න සක්කොමි. අයමාගන්ත්වා අවස්සං අනිච්ඡන්තස්සාපි මෙ වත්ථං ගණ්හිස්සති. මයාපිස්ස නිරත්ථකෙන හරිතුං න සක්කා, දානවසෙනස්ස දස්සාමීති සන්නිට්ඨානමකාසි. අථ චොරො ආගන්ත්වා වත්ථකං පරාමසි. අථ සො පුරිසො චිත්තං පසාදෙත්වා ඉමං මම වත්ථදානං භවභොගසුඛත්ථාය පච්චයො හොතූති වත්ථං දත්වා දුච්ඡාදිත්තත්තා මහාමග්ගං පහාය අඤ්ඤෙන ජඞ්ඝාමග්ගෙන ගච්ඡන්තො ආසිවිසෙන දට්ඨො කාලං කත්වා හිමවන්තප්පදෙසෙ ද්වාදසයොජනිකෙ කනකවිමානෙ නෙකච්ඡරාසහස්සපරිවුතො නිබ්බත්ති. විමානං පනස්ස පරිවාරෙත්වා තියොජනිකෙ ඨානෙ කප්පරුක්ඛා නිබ්බත්තිංසු.

i. දුප්පත් මනුෂ්‍යයා වාසය කළේ කොහි ද?
ii. දුර සිට එන සොරා දැක ඔහු කුමක් සිතුවේ ද?
iii. 'ඉමං මම වත්ථදානං භවභොගසුඛත්ථාය පච්චයො හොතු' යන්නහි අර්ථය ලියන්න.
iv. වස්ත්‍ර දන් දුන් මිනිසා මියගොස් උපන් දිව්‍ය විමානයේ ස්වරූපය කෙබඳු ද?

(ලකුණු 1 + 1 + 2 + 2 = 6 යි)

**04.** i. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායන් දෙකක නම් ලියන්න.
ii. වර්ගාන්තාක්ෂර හා අඝෝෂාක්ෂර පිළිවෙලින් ලියා දක්වන්න.
iii. අක්ෂර උත්පත්ති ස්ථාන පිළිබඳව හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 5 + 8 = 15 යි)

**05.** i. නාම පද ප්‍රභේද 02ක් නම් කරන්න.
ii. ද්විලිංගික නාම පද 04 ක් ලියන්න.
iii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | තතියා විභක්ති | | පඤ්චමී විභක්ති | | සත්තමී විභක්ති | |
|---|---|---|---|---|---|---|
| ධනවා | ධනවතා<br>ධනවන්තෙන | | | | | |
| ත | | | තම්හා, තස්මා | | | |
| කිං | කෙන | | | | | කෙසු |

(ලකුණු 4 + 4 + 7 = 15 යි)

**06.** i. අනාගත ආඛ්‍යාතය හඳුන්වන නම ලියන්න.
ii. යං තිකාලං තිපුරිසං - ක්‍රියාවාචි තිකාරකං,
අත්තිලිංගං ද්විවචනං - තදාඛ්‍යාතන්ති වුච්චති. මෙහි අර්ථය පැහැදිලි කරන්න.
iii. √භූ ධාතුව අජ්ජතනී ආඛ්‍යාත පරස්සපදයේ වරනගා වගු කතකර දක්වන්න.

(ලකුණු 2 + 6 + 7 = 15 යි)

**07.** i. පාලි භාෂාවේ ඇති ප්‍රධාන සන්ධි ප්‍රභේද 03 නම් කරන්න.
ii. 'සරා සරෙ ලොපං' යන සූත්‍රයට උදාහරණ 04 ක් ලියා දක්වන්න.
iii. පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කර අදාළ සූත්‍රය ද ලියා දක්වන්න..
අ. කිංසු + ඉධ ආ. ජායා + ඉව
ඉ. අභි + උග්ගතො ඊ. සු + ආගතං
උ. පති + අන්තං ඌ. ති + අංගුලං

(ලකුණු 3 + 4 + 8 = 15 යි)

**08.** i. මහාවංශය රචනා කිරීමේ අරමුණු දෙකක් ලියන්න.
ii. මහාවංශයේ දැකිය හැකි මහාකාව්‍යය ලක්ෂණ හතරක් ලියා දක්වන්න.
iii. වංගර රජුගේ දියණියගේ චරිතය පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 2 + 4 + 9 = 15 යි)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි) All Rights Reserved) | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය- 2019** |
| | Primary Piriven Mid Term Test - 2019 |
| | 04 වසර / Grade 04 |
| | පාලි කාලය : පැය තුන යි |
| | **PALI** Time : Three Hours |

- **I කොටසටත්** II කොටසින් 02, 03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

## I කොටස

01. මොග්ගල්ලායන සම්ප්‍රදායට අනුව පාලි වර්ණ මාලාවේ ස්වර ගණන,

i. 08 කි. ii. 10 කි. iii. 13 කි. iv. 41 කි.

02. මූර්ධජ අකුරු ඇතුළත් නිවැරදි වරණය වනුයේ,

i. අ, ආ, ග, ස, හ ii. බ, ඹ, ස, ඡ, ඣ iii. ඞ, ඤ, ණ, න, ම iv. ට, ඩ, ණ, ර, ළ

03. අක්ෂර වින්‍යාසය නිවැරදි ව ලියා ඇති වරණය වනුයේ,

i. උපොසථං, ආරුළ්හවාණිජා, ඉතො පට්ඨාය, අක්ඛි, වෙය්‍යාවච්චං
ii. උපොසථං, ආරුළ්හවාණිජා, ඉතො පට්ඨාය, අක්ඛි, වෙය්‍යාවච්ඡං
iii. උපොසථං, ආරුළ්හවානිජා, ඉතො පට්ඨාය, අක්කි, වෙය්‍යාවච්චං
iv. උපොසතං, ආරුළ්හවාණිජා, ඉතො පට්ටාය, අක්ඛි, වෙය්‍යාවච්චං

04. යම් දෙයක් කැමැත්තෙන් ප්‍රදානය කිරීමේ දී එය ලබන්නා තබනුයේ,

i. දුතියා විභක්තියෙනි. iii. ඡට්ඨී විභක්තියෙනි.
ii. චතුත්ථී විභක්තියෙනි. iv. සත්තමී විභක්තියෙනි.

05. ආඛ්‍යාත පදයක් සම්බන්ධයෙන් මින් නිවැරදි ප්‍රකාශයක් **නො** වන්නේ කුමක් ද?

i. කාලත්‍රයකින් යුක්ත වේ. iii. ලිංග භජනය කිරීමක් ඇත.
ii. වචනද්වයක් හා පුරුෂත්‍රයක් ඇත. iv. යම්කිසි වීමක් හෝ කිරීමක් අඟවයි.

06. මේ අතරින් ද්විලිංගික නාමයක් වන්නේ කුමක් ද?

i. පුඤ්ඤ ii. දෙව iii. ධම්ම iv. සබ්බ

07. 'ගුණවන්තු' ශබ්දයේ '**ගුණවතො**' යන පදයේ විභක්තිය වනුයේ,

i. පඨමා ය ii. දුතියා ය iii. තතියා ය v. iv. චතුත්ථී ය

08. '**අපචො**' යන ක්‍රියාපදය පිළිබඳව නිවැරදි ප්‍රකාශයක් වනුයේ,

i. පච ධාතුවෙන් නිපන් අජ්ජතනී ආඛ්‍යාත මජ්ඣිම පුරිස ඒකවචන රූපය යි.
ii. පච ධාතුවෙන් නිපන් හීයත්තනී ආඛ්‍යාත පඨම පුරිස ඒකවචන රූපය යි.
iii. පච ධාතුවෙන් නිපන් පඤ්චමී ආඛ්‍යාත මජ්ඣිම පුරිස ඒකවචන රූපය යි.
iv. පච ධාතුවෙන් නිපන් කාලාතිපත්ති ආඛ්‍යාත පඨම පුරිස ඒකවචන රූපය යි.

09. අනුමත කිරීමෙහි හා පරිකල්පනාර්ථයෙහි යෙදෙන ආඛ්‍යාත විභක්තිය වනුයේ,

i. පඤ්චමී ආඛ්‍යාතය යි.
ii. සත්තමී ආඛ්‍යාතය යි.
iii. කාලාතිපත්ති ආඛ්‍යාතය යි.
iv. පරොක්ඛා ආඛ්‍යාතය යි.

10. '**2019**' සංඛ්‍යාව පාලි ක්‍රමයට නිවැරදිව ලියා ඇති වරණය කුමක් ද?

i. එකූනවීසතිද්විසහස්සං
ii. ද්විසහස්සාධිකඑකූනවීසතිං
iii. ද්විසහස්ස නවදසං
iv. එකූනවීසත්‍යාධිකද්විසහස්සං

11. '**කල් ඇතිව ම**' යන අදහස දෙන නිපාත පදය කුමක් ද?

i. පටිගච්චෙව
ii. අධුනා
iii. එතරහි
iv. පුරතො

12. '**නයෙ පරං යුත්තෙ**' යන බාලාවතාර සූත්‍රයෙන් සිදුකෙරෙන කාර්යය වනුයේ,

i. පදයක ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීමයි.
ii. සන්ධි කාර්යයෙන් පසු පද දෙක එකතු කිරීමයි.
iii. සන්ධි වන පද දෙකෙන් මුල් ස්වරය ලොප් කිරීමයි.
iv. සන්ධි වන පද දෙකෙන් පර ස්වරය ලොප් කිරීමයි.

13. පර පදයේ ස්වරයක් ඇති විට පද මැදට '**ය**' අකුර ආගම වනුයේ කිනම් සූත්‍රයෙන් ද?

i. යමෙදන්තස්සාදෙසො
ii. ඉවණ්ණො යං නවා
iii. යවමදනතරළාචාගමා
iv. සයෙ ච

14. '**ක්වචාසවණ්ණං ලුත්තෙ**' යන සූත්‍රයෙන් සිදුවෙන සන්ධි කාර්යය වනුයේ,

i. පූර්වස්වරය ලොප් කළ විට පරස්වරයේ ඇති 'ඉ'කාරයට එ, ඔ අකුරු ආදේශ වේ.
ii. පරස්වරය ලොප් කළ විට පූර්වස්වරයේ ඇති 'ඉ'කාරයට එ, ඔ අකුරු ආදේශ වේ.
iii. පූර්වස්වරය ලොප් කළ විට පරස්වරය වූ 'ඉ'උ වර්ණයන්ට එ, ඔ අකුරු ඇතැම් විට ආදේශ වේ.
iv. පූර්වස්වරය ලොප් කළ විට පරස්වරයේ ඇති 'ඉ' උ වර්ණයන්ට එ, ඔ අකුරු හැමවිට ම ආදේශ වේ.

15. කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීමේ දී අවශ්‍ය කාරණයක් නො වන්නේ මින් කුමක් ද?

i. කර්තෘ පදය අනුක්ත වී තතියා විභක්තියෙන් තැබීම.
ii. කර්ම පදය උක්ත වී පඨමා විභක්තියෙන් තැබීම.
iii. අනුක්ත කර්තෘ පදයට අනුව ක්‍රියා පදය තැබීම.
iv. උක්ත කර්ම පදයට අනුව ක්‍රියා පදය තැබීම.

16. පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය ලෙස සැලකෙන්නේ කුමක් ද?

i. දීපවංසය ii. බුද්ධවංසය iii. අනාගතවංසය iv. මහාවංසය

17. මහාවංසයේ පළමු කොටසේ කතුවරයා ලෙස සැලකෙන්නේ,

i. බුද්ධඝෝෂ හිමියන් ය.
ii. ධර්මකීර්ති හිමියන් ය.
iii. බුද්ධනාග හිමියන් ය.
iv. මහානාම හිමියන් ය.

18. මහාවංසයට මූලාශ්‍රය වූ කෘතියක් ලෙස **නො සැලකෙන්නේ,**

i. දීපවංසය යි.
ii. සංඛේපට්ඨකථාව යි.
iii. උත්තර විහාරට්ඨකථාව යි.
iv. සීහළට්ඨකථාව යි

19. 'ආගතාගතා අන්තො ගෙහෙ <u>සාපතෙය්‍යං</u> පස්සිස්සන්ති' මෙහි ඉරි ඇඳි පදයේ නිවැරදි අර්ථය කුමක් ද?

i. මුදල් ii. වස්තුව iii. අල්මාරිය iv. වී බිස්ස

20. 'න මෙ එතාය දින්නභතියා අත්‍ථො' මෙම වාක්‍යාංශයේ අර්ථය කුමක් ද?

i. මැ විසින් දුන් වැටුපෙන් මට එලක් නැත.
ii. මැ විසින් දුන් රස ආහාරවලින් එලක් නැත.
iii. මැ විසින් දුන් බත්වලින් මට වැඩක් නැත.
iv. මැ විසින් දුන් සේවකයාගෙන් මට වැඩක් නැත. (2×20 = 40)

## II කොටස

02. **අ.** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථෙකො මක්කටො හත්ථිං දිවසෙ දිවසෙ තථාගතස්ස උපට්ඨානං කරොන්තං දිස්වා අහම්පි කිඤ්චිදෙව කරිස්සාමීති විචරන්තො එකදිවසං නිම්මක්ඛිකං දණ්ඩකමධුං දිස්වා දණ්ඩකං භඤ්ජිත්වා දණ්ඩකෙනෙව සද්ධිං මධුපටලං සත්ථු සන්තිකං ආහරිත්වා කදලිපත්තං ඡින්දිත්වා තත්ථ ඨපෙත්වා අදාසි. සත්ථා ගණ්හි. මක්කටො කරිස්සති නු ඛො පරිභොගං න කරිස්සතීති ඔලොකෙන්තො ගහෙත්වා නිසින්නං දිස්වා කින්නු ඛො'ති චින්තෙත්වා දණ්ඩකොටියං ගහෙත්වා පරිවත්තෙත්වා ඔලොකෙන්තො අණ්ඩකානි දිස්වා තානි සනිකං අපනෙත්වා අදාසි. සත්ථා පරිභොගමකාසි. සො තුට්ඨමානසො තං තං සාඛං ගහෙත්වා නච්චන්තො අට්ඨාසි. තස්ස ගහිත සාඛා'පි අක්කන්ත සාඛා'පි භිජ්ජි. සො එකස්මිං ඛාණුමත්ථකෙ පතිත්වා නිබ්බිද්ධගත්තො සත්ථරි පසන්නෙන චිත්තෙන කාලං කත්වා තාවතිංසභවනෙ නිබ්බත්ති.

(ලකුණු - 09)

**ආ.** පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං
'සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය'
අලභං නිසෙධකං තස්ස - හත්ථික්ඛන්ධගතං පුරෙ,
ආදෙතු 'සීහදායී'ති - සහස්සං සො පචාරයි.
තථෙව ද්වෙ සහස්සානි - තීණි චා'පි නරිස්සරො
ද්වීසු වාරෙසු වාරෙසි - මාතා සීහභුජං හි තං (ලකුණු = 6)

03. **අ.** පාලියට නගන්න.

i. අපි සියලු දෙනාම දිනපතා බුදුන් වඳිමු.
ii. සියලු සත්වයෝ සතුටු සිතැත්තෝ වෙත්වා!
iii. පමාවීම මරණයට හේතු වෙයි. නොපමාව නිවණට හේතු වෙයි.

(ලකුණු 2 x 3 = 6)

**ආ.** ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එකස්මිං කිර සමයෙ ලංකායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූලුපට්ඨකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගලඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි. රාජා කිර තං හත්ථිනං ගතට්ඨානං උපපරික්ඛාපෙන්තො අදිස්වා චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙන්තො චූලුපට්ඨාකතිස්සාමච්චං පාචීනපස්සං පෙසෙසි. සෙසදිසාසු ගතා හත්ථිං න පස්සිංසු. සො පනෙස අමච්චො ගාමනිගමපරම්පරාය විචරන්තො තමෙව විහාරං සම්පාපුණි. තතො කණ්ඩුලො නාම වාරණරාජා තදා සුපක්කං කාරඵලසහිතං කාරසාඛං භින්දිත්වා භික්ඛූනං පතිගණ්හාපෙසි.

i. තිස්ස දුටුගැමුණු රජතුමාගේ කවරෙක් වී ද?
ii. ඉහත ඡේදයෙන් නිපාත 04ක් උපුටා දක්වන්න.
iii. ඇමතියා විහාරයට යන විට කණ්ඩුල ඇතා කරමින් සිටි දේ පැහැදිලි කරන්න.
iv. සංයතවූවන් ඉදිරියෙහි තිරිසන්ගතවූවෝ ද දමනය වන ආකාරය ඉහත ඡේදය ඇසුරින් කෙටියෙන් පහදන්න.

(ලකුණු 1 + 2 + 3 + 3 = 9)

04. i. කච්චායන සම්ප්‍රදායට අයත් ව්‍යාකරණ ග්‍රන්ථ 02ක් නම් කරන්න.
ii. වර්ගාක්ෂර 25 පිළිවෙළින් ලියා දක්වන්න.
iii. පහත සඳහන් සූත්‍රවලට අදාළ අකුරු ලියන්න.
**අ.** ළන්තාඤ්ඤෙ සොසා
**ආ.** තවග්ගලසා දන්තජා (ලකුණු 2 + 5 + 8 = 15)

05. i. සර්වනාම පද 04 ක් ලියා දක්වන්න.

ii. **දුතියා** හා **චතුර්ථී** විභක්ති යෙදෙන මුඛ්‍යාර්ථ කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | දුතියා විභක්ති | | චතුත්ථි විභක්ති | | සත්තමී විභක්ති | |
|---|---|---|---|---|---|---|
| බුද්ධිමා | ............... | ............... | ............... | ............... | ............... | බුද්ධිමන්තෙසු |
| ගච්ඡන්ත | ගච්ඡන්තං | ............... | ............... | ............... | ............... | ............... |
| එත | එතං | ............... | ............... | එතෙසං<br>එතෙසානං | ............... | ............... |

(ලකුණු 2 + 6 + 7 = 15)

06. i. 'ආශීර්වාද කිරීම' යන අර්ථයෙහි යෙදෙන ආඛ්‍යාතය හඳුන්වන පාඨය ලියන්න.

ii. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

**අ.** චකි කොටිල්ලයාත්‍රාසු ............................................

**ආ.** ඉක්ඛොතු දස්සනඞ්කෙසු ............................................

iii. √**පච** ධාතුව අජ්ජතනී ආඛ්‍යාත කත්තරි **පරස්සපද**යේ වරනඟා වගු ගත කොට දක්වන්න.

(ලකුණු 2 + 6 + 7 = 15)

07. i. සන්ධි කිරීමේ දී භාවිත කරන ක්‍රමෝපායන් 04ක් නම් කරන්න.

ii. '**වග්ගන්තං වා වග්ගෙ**' යන සූත්‍රයට අදාළ උදාහරණ 05ක් ලියන්න.

iii. පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට ලියන්න.

| | |
|---|---|
| **අ.** උප + ඉක්ඛති | **උ.** මහා + භය |
| **ආ.** කිංසු + ඉධ | **ඌ.** එවං + එව |
| **ඉ.** අභි + උග්ගතො | **එ.** ලොක + අග්ගො |
| **ඊ.** එතං + අවොච | **ඔ.** පර + සහස්සං |

(ලකුණු 2 + 5 + 8 = 15)

08. i. සමාස හඳුන්වන වාක්‍යය ලියා දක්වන්න.

ii. සමාස ප්‍රභේද 06 නම් කරන්න.

iii. පහත දැක්වෙන සමාස කවර සමාස ප්‍රභේදයකට අයත් දැයි නම් කරන්න.

| | |
|---|---|
| **අ.** නීලුප්පලං | **උ.** උපනගරං |
| **ආ.** චන්දසූරියා | **ඌ.** චතුද්දිසා |
| **ඉ.** සීතුණ්හං | **එ.** ආරුළ්හවාණිජා |
| **ඊ.** අසුරො | |

(ලකුණු 2 + 6 + 7 = 15)

***

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்வி பிரிவு
Ministry of Education – Division of Piriven Education

# මධ්‍යවාර පරීක්ෂණය - 2022
இடைக்கால பரீட்சை - 2022
Mid Term Test – 2022

පැය එකයි

**පාලි - I** **4 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. කච්චායන සම්ප්‍රදායට අනුව පාලි වර්ණ මාලාවේ අක්ෂර ගණන.
(1) 40කි. (2) 41කි. (3) 42 කි. (4) 43 කි.

02. මූර්ධජ අකුරු ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
(1) අ, ආ, ග, ඝ, හ (2) බ, ඩ, ස, ඡ, ඣ
(3) ඩ, ඤ, ණ, න, ම (4) ට, ඩ, ණ, ර, ළ

03. අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වරණය වනුයේ
(1) උපොසථං, ආරුළ්හවාණිජා, ඉතොපට්ඨාය, අකඛි, වෙය්‍යාවච්චං
(2) උපොසථං, ආරුළ්හවාණිජා, ඉතොපට්ඨාය, අක්ඛි, වෙය්‍යාවච්ඡං
(3) උපොසථං, ආරුළ්හවාණිජා, ඉතොපට්ඨාය, අක්කි, වෙය්‍යාවච්චං
(4) උපොසතං, ආරුළ්හවාණිජා, ඉතොපට්ටාය, අක්ඛි, වෙය්‍යාවච්චං

04. පාලි අක්ෂරමාලාවේ ඇති ඝෝෂාක්ෂර ගණන වන්නේ,
(1) 08 කි. (2) 11 කි. (3) 12 කි. (4) 21 කි.

05. පාලි වංසකථා සාහිත්‍යයේ ආරම්භක කෘතිය වනුයේ
(1) ථූපවංසය යි. (2) අනාගත වංසය යි.
(3) බුද්ධවංසය යි. (4) මහා වංසය යි.

06. පාලි භාෂාවේ තද්ධිත ප්‍රභේද ගණන,
(1) 04 කි. (2) 05 කි. (3) 06 කි. (4) 08 කි.

07. ප්‍රශ්නවාචී සර්වනාම පදයක් නොවන්නේ,
(1) කති (2) කීව (3) කුත්‍ර (4) කතම

08. සංඛ්‍යාවාචී ''චතු'' ශබ්දයෙහි නපුංසක ලිංග පඨමා විභක්ති පදය වන්නේ,

(1) චත්තාරො (2) චතතාරි
(3) චතුරො (4) චතසෙසා

09. ආඛ්‍යාත පද අතුරෙන් පඤ්චමී මධ්‍යම පුරුෂ එක වචනය වන්නේ

(1) පසස (2) පචතු (iii) ගචඡාමි (iv) භවනතු

10. මේ අතරින් ස්ත්‍රී ලිංග නාමයක් වන්නේ,

(1) අතත (2) පුඤඤ
(3) අමබු (4) කුසුම

11. **''ගුණ නාම''** ගණයට අයත් පද ඇති වරණය වන්නේ ,

(1) රාජා, මනුසස, ඉතථි, පකති (2) උදක, කූප, චතථ, පීඨ
(3) ධමම, කමම, රමම, චමම (4) සෙත, කණහ, උචච, ථූල

12. යම් දෙයක් කැමැත්තෙන් ප්‍රදානය කිරීමේදී එය ලබන්නා තබනුයේ,

(1) 'දුතියා' විභක්තියෙනි. (2) 'චතුතථී' විභක්තියෙනි.
(3) 'ඡටඨී' විභක්තියෙනි. (4) 'සතතමී' විභක්තියෙනි.

13. ආඛ්‍යාත පදයක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් **නො වන්නේ,**

(1) කාලත්‍රයක් ඇත. (2) වචනද්වයක් හා පුරුෂත්‍රයක් ඇත.
(3) ලිංග භජනය කිරීමක් ඇත. (4) යම්කිසි වීමක් හෝ ඇඟවීමක් ඇත.

14. අනුමත කිරීමෙහි හා පරිකල්පනාථර්යෙහි යෙදෙන ආඛ්‍යාත විභක්තිය වනුයේ,

(1) 'පඤචමී' ආඛ්‍යාතය යි. (2) 'සතතමී' ආඛ්‍යාතය යි.
(3) 'කාලාතිපතති' ආඛ්‍යාතය යි. (4) 'පරොකඛා' ආඛ්‍යාතය යි.

15. **කල් ඇතිවම** යන අදහස දෙන නිපාත පදය වනුයේ,

(1) පටිගචෙචව (2) අධුනා
(3) එතරහි (4) පුරතො

16. **''නයෙ පරං යුතෙත''** යන බාලාවතාර සූත්‍රයෙන් සිදුකෙරෙන කාර්ය වනුයේ,

(1) පදයක ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීමයි.
(2) සන්ධි කාර්යෙන් පසු පද දෙක එකතු කිරීමයි.
(3) සන්ධි වන පද දෙකෙන් මුල් ස්වරය ලොප් කිරීමයි.
(4) සන්ධි වන පද දෙකෙන් පර ස්වරය ලොප් කිරීමයි.

17. වර්ගන්තාක්ෂර හැඳින්වීමට අපර නාමයක් වන්නේ,

(1) සිථිලාක්ෂර යන්න යි. (2) ඝෝෂාක්ෂර යන්න යි.
(3) ඌෂ්මාක්ෂර යන්න යි. (4) අනුනාසිකාක්ෂර යන්න යි.

18. **''කමමධාරය''** සමාස පද පමණක් ඇති වරණය වන්නේ,

(1) මහාමති, අකුසලං, සදධාධනං, නීලුපපලං
(2) උපනගරං, අනුවාතං, යථාකමමං, දිටඨධමෙමා
(3) ධමමරතො, තිභවා, සුගනෙධා, ගාමගතො
(4) චොරභයං, මාතාපිතරො, සුරනරො, පුබබාපරං

19. "වංගෙසු වංග නගරෙ
වංග රාජා අහු පුරෙ,
කාලිංග රඤ්ඤො ධීතාසි
....................................."
යන ගාථාවේ සිව්වැනි පදය වන්නේ,

(1) ලජ්ජාසි ජිගුච්ඡිතා (2) මහෙසී තස්ස රාජිනො
(3) රාජධීතා ජනෙසි සා (4) ධීතරං සීහසීවලිං

20. මහාවංසයෙහි මහානාම හිමියන් විසින් රචිත පළමු පරිච්ඡේදය වන්නේ,
(1) සහාසම්මතවංස (2) විජයාගමනං
(3) මහියංගනාගමනං (4) නානාදෙසපසාදො

21. පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය ලෙස සැලකෙන්නේ,
(1) දීපවංසය (2) බුද්ධවංසය (3) අනාගතවංසය (4) මහාවංසය

22. අනාගතවංසයේ ගාථා ගණන වන්නේ,
(1) 140 කි. (2) 141 කි. (3) 142 කි. (4) 145 කි.

23. **"සොළසවස්සික කාලෙ"** යන්නෙහි අර්ථය වන්නේ,
(1) පහළොස් වයසැති කාලයෙහි (2) දොළොස් වයසැති කාලයෙහි
(3) දහසය වයසැති කාලයෙහි (4) දහහතර වයසැති කාලයෙහි

24. සර්වනාම පද පමණක් ඇතුළත් **නොවන** වරණය වන්නේ,
(1) සබ්බ, කතර, උභය (2) සබ්බ, අඤ්ඤ, අපර
(3) සබ්බ, අච්ච, පර (4) සබ්බ, ය, එත

25. **"ඉදානි"** යන අදහස දෙන සමානාර්ථවත් නිපාත පදයක් වන්නේ,
(1) සම්පති (2) අථවා
(3) උදාහු (4) අභිණ්හං

26. සමාස පදයක් වනුයේ,
(1) ධම්මරතො (2) සමං
(3) සමන්තා (4) සාධුකං

27. **'එ'** කාරයට **'රි'** කාරාදේශය සිදුවන බාලාවතාර සූත්‍ර පාඨය වන්නේ,
(1) ඉවණ්ණොයනනවා (2) යමෙදන්තස්සාදෙසො
(3) වමොදුදන්තානං (4) එවාදිස්සරිපුබ්බොච රස්සො

28. **"ත්‍යජ්ජ"** යන්නෙහි නිවැරදි විසන්ධි පදය වන්නේ,
(1) තෙ+ අජ්ජ (2) ති+ අජ්ජ
(3) ත්‍ය+ අජ්ජ (4) තෙන+ අජ්ජ

29. **"අච්චන්තං"** මෙම පදයෙහි නිවැරදි විසන්ධි පදය වන්නේ,
(1) අචි+අන්තං (2) අත්‍ය+අන්තං
(3) අති+අන්තං (4) අච්ච+න්තං

30. **තප්පුරිස සමාස** පදයකට උදාහරණයකි.

(1) චන්දසූරියා (2) ජිනවචනං
(3) කණ්හසප්පො (4) සුභිකඛං

31. **"සූකරික"** යන පදය,

(1) සන්ධි පදයකි. (2) සමාස පදයකි.
(3) අව්‍ය පදයකි. (4) තද්ධිත පදයකි.

32. පාලි **බෝධිවංසයෙහි** කතුවරයා වන්නේ,

(1) දාඨානාග තෙරුන් ය. (2) උපතිස්ස තෙරුන් ය.
(3) වාචිස්සර තෙරුන් ය. (4) මහානාම තෙරුන් ය.

33. **සො දුක්ඛිතො '<u>කසිරෙන</u>' පුත්තදාරෙ පොසෙති** යන්නෙහි අංකිත පදයේ අර්ථය වන්නේ,

(1) දුකසේ (2) ගොවිතැනින්
(3) කරදර කරමින් (4) කපටිකමින්

34. **"බුද්ධො ධම්මං දෙසෙති"** මෙම වාක්‍ය කර්ම කාරකයෙන් දැක්වෙන්නේ,

(1) "බුද්ධො ධම්මං දෙසීයති" යනුවෙනි. (2) "බුද්ධො ධම්මං දෙසිතො" යනුවෙනි.
(3) "බුද්ධෙන ධම්මො දෙසීයතෙ" යනුවෙනි. (4) "බුද්ධෙන ධම්මො දෙසෙති" යනුවෙනි.

35. **චුල්ලපන්ථකො '<u>සහස්සක්ඛත්තුං</u>' අත්තානං** මෙහි ඉරි ඇඳි පදය,

(1) සංඛ්‍යා තද්ධිත පදයකි. (2) අනෙකත්ථ තද්ධිත පදයකි.
(3) භාව තද්ධිත පදයකි. (4) අව්‍ය තද්ධිත පදයකි.

36. **"ගුළමණ්ඩලෙ"** යන්නෙහි අර්ථය,

(1) 'වාද පිටියෙහි' ය. (2) 'ක්‍රීඩා පිටියෙහි' ය.
(3) 'සොහොන් පිටියෙහි' ය. (4) 'යුද පිටියෙහි' ය.

37. **"සලලකො සූචියො"** යන පදයේ නිවැරදි අර්ථය වන්නේ,

(1) මොණර පිහාටු ය. (2) කුරුලු පිහාටු ය.
(3) සර්ප හැව ය. (4) ඉත්තෑ කුරු ය.

38. **"උව සඳෙද සමවායෙ..........."** මෙම ගාථාවෙහි **සිව්වන පදය** වන්නේ,

(1) 'කුව සංකොවනෙ' යන්නයි. (2) 'දිකෙබා පනය මුදධිසු' යන්නයි.
(3) 'තකී ඉධ ගතාදිසු' යන්නයි. (4) 'වලඤ්ජා තු වලඤ්ජනෙ' යන්නයි.

39. **"ජංඝාමග්ග "** යනු,

(1) ප්‍රධාන පාරකි. (2) අඩි පාරකි.
(3) ගම්සභා පාරකි. (4) බොරලු පාරකි.

40. **'වෙන්වීමේ අර්ථය'** ප්‍රකාශ වන්නේ,

(1) පඨමා විභක්තියෙනි. (2) සත්තමී විභක්තියෙනි.
(3) පඤ්චමී විභක්තියෙනි. (4) චතුත්ථී විභක්තියෙනි.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැය තුනයි

**පාලි ii** විභාග අංකය : ........................................... **4 ශ්‍රේණිය**

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද, II කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.**

## I කොටස

01. (අ). සිංහලයට නගන්න.

සීහලදීපෙ කිර දණ්ඩගොණගාමෙ එකො සිගාලො තත්ථ තත්ථ ගොචරං පරියෙසමානො එකං සල්ලකං දිස්වා ගණ්හිතුං ධාවි. තස්මිං ඛණෙ සල්ලො සූචියො විජ්ඣි. තතො එකා සූචි සිගාලස්ස අක්ඛිං භින්දි. තෙන සො ‘කාණසිගාලො’ති පඤ්ඤායි. අපරභාගෙ ගොචරත්ථාය ඉතො චිතො විචරන්තං අජගරො භොගෙන බන්ධි. අථෙකො ගොපාලකො තං අජගරෙන නිප්පිළීයමානං දිස්වා තස්ස කාරුඤ්ඤෙන අජගරෙන සද්ධිං වායමිත්වා තං විස්සජ්ජාපෙසි.

(ලකුණු 06)

(ආ). සිංහලයට නගන්න.

සීහො සීසං ගුහං ගන්ත්වා- තෙ අදිස්වා තයො ජනෙ,
අට්ටිතො පුත්තසොකෙන- න ච ඛාදි න චාපිවි.

දාරකෙ තෙ ගවෙසෙන්තො- අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො’ව- යං යං ගාමමුපෙති සො.

පච්චන්තවාසිනො ගන්ත්වා- රඤ්ඤො තං පටිවෙදයුං,
‘‘සීහො පීළෙති තෙ රට්ඨං- තං දෙව පටිසෙධය’’.

(ලකුණු 06)

02. (අ) පාලියට නගන්න.

i. බුදුරදුන් විසින් දෙවියන්ට ද මිනිසුන්ට ද ධර්මය දෙසන ලදී.
ii. අප විසින් බොහෝ සිසුන්ට පාඩම් කියා දෙන ලදී.
iii. තොප විසින් බුදුරදුන්ට මල් පූජා කරන ලදී. (ලකුණු 06)

(ආ) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න.

අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සත්ථවාහකුලෙ පටිසන්ධිං ගහෙත්වා වයප්පත්තො පඤ්චහි සකටසතෙහි වණිජ්ජං කරොන්තො විචරති. සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි. තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා මුට්ඨිනා ගහිතා හත්ථෙ න තිට්ඨති. සුරියුග්ගමනතො පට්ඨාය අඞ්ගාරරාසිවිය උණ්හා හොති න සක්කා අක්කමිතුං. තස්මා තං පටිපජ්ජන්තා දාරුදකතිලතණ්ඩුලාදිනි සකටෙහි ආදාය රත්තිමෙව ගන්ත්වා අරුණුග්ගමනෙ සකටානි පරිවත්තං කත්වා මත්ථකෙ මණ්ඩපං කාරෙත්වා කාලස්සෙව ආහාරකිච්චං නිට්ඨාපෙත්වා ඡායාය නිසින්නා දිවසං ඛෙපෙත්වා අත්ථංගතෙ සුරියෙ සායමාසං භුඤ්ජිත්වා භූමියා සිතලාය ජාතාය සකටානි යොජෙත්වා ගච්ඡන්ති. සමුද්දගමණසදිසමෙව ගමනං හොති. ථලනියාමකො නාම ලද්ධුං වට්ටති. සො තාරකසඤ්ඤාය සත්ථං තාරෙසි.

i. කාන්තාරයෙහි වැලි සියුම් බව ජාතකකරු කීවේ කෙසේ ද ?

ii. ඡේදයෙහි එන උපමා පද දෙකක් උපුටා ලියන්න.

iii. කාන්තාරයෙන් එතරවන අය කවර ලකුණකින් එතර වේ ද ? (ලකුණු 06)

## II කොටස

03. (අ) පහත දැක්වෙන බාලාවතාර සූත්‍රවල අර්ථ ලියන්න.

i. පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ.

ii. නයෙ පරං යුත්තෙ.

iii. සරා සරෙ ලොපං. (ලකුණු 06)

(ආ) පහත දැක්වෙන අක්ෂර ප්‍රභේදයන්ට අදාළ බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

i. කණ්ඨජාක්ෂර

ii. ඝෝෂාක්ෂර

iii. අඝෝෂාක්ෂර (ලකුණු 06)

04. (අ) නාමපද ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04)

(ආ) පහත දැක්වෙන විභක්තිවල නාම විභක්ති ප්‍රත්‍ය නම් කරන්න.

i. චතුත්ථී ii. පඤ්චමී (ලකුණු 04)

(ඉ) පහත නාම පදවල විභක්තිය ලියන්න.

i. උපාසකෙන ii. ලෙඛනියා iii. දාරකස්ස iv. රූපානං (ලකුණු 04)

05. (අ) **නිර්ධාරණාර්ථයට** හා **භාවසත්තමී** ප්‍රයෝගයට උදාහරණය බැගින් දෙන්න. (ලකුණු 04)

(ආ) පහත පදවල ව්‍යාකරණ ප්‍රයෝගය නම් කරන්න.

i. අරහන්තෙසු ii. ගච්ඡන්තෙ

iii. රුක්ඛතො iv. භික්ඛුසු (ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන ක්‍රියා විශේෂණ පදවල අර්ථ ලියන්න.

i. අභික්ඛණං ii. සනිකං

iii. විසුං iv. පුරතො (ලකුණු 04)

06. (අ) පහත දැක්වෙන සංඛ්‍යා පාලියෙන් ලියන්න.

i. 2022 ii. 2023 (ලකුණු 02)

(ආ) පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

i. සුවෙ මයං නගරං ගන්ත්වා භණ්ඩානි කිණිස්සාම.

ii. සීහො ධාවිත්වා මිගං මාරෙසි.

iii. ගොපාලො ගොණෙ වික්කිණාති.

iv. චොරා මනුස්සානං අසෙස චොරෙන්ති. (ලකුණු 04)

(ඉ) පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නොඅඩු රචනාවක් ලියන්න.

i. අනුරාධපුරං
ii. දාඨාධාතුං
iii. මම ජීවිතං
iv. සීහලදීපං (ලකුණු 06)

07. (අ) සන්ධි හඳුන්වන බාලාවතාර සූත්‍රය ලියා අර්ථය ලියන්න. (ලකුණු 02)

(ආ) සන්ධි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(ඉ) පහත සන්ධි පද විසන්ධි කරන්න.

i. උපෙක්ඛති ii. ත්‍යජ්ජ iii. අබ්භුග්ගතො
iv. නිරුපද්දවං v. නාගචෙජ්ජය්‍ය vi. තතොපපභුති (ලකුණු 06)

08. (අ) **"කතඤ්ඤු සිගාලො"** යන කතාව අන්තරගත වන ග්‍රන්ථය කුමක් ද ? (ලකුණු 02)

(ආ) මහා වංසයේ පහත කොටස්වල කතුවරු නම් කරන්න.

i. ආරම්භයේ සිට 37 පරිච්ඡේදය දක්වා.

ii. 37 පරිච්ඡේදයේ සිට 79 පරිච්ඡේදය දක්වා.

iii. 80 පරිච්ඡේදයේ සිට 4 වන පැරකුම්බා රජු දක්වා.

iv. 4 වන පැරකුම්බා සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වා. (ලකුණු 04)

(ඉ) පාලි වංසකතා සාහිත්‍ය පිළිබඳ ප්‍රාමාණික හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்வி பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Year Term Test – 2023

පැය එකයි

**පාලි - I** **4 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය ගණනින්,

1. 01කි. 2. 02කි. 3. 03කි. 4. 04කි.

02. පාලි අක්ෂර මාලාවේ හ්‍රස්වාක්ෂර නිවැරදිව දැක්වෙන වර්ණය තෝරන්න.

1. ආ, ඊ, උ, 2. අ, එ, ඔ
3. උ, ඉ, අ, 4. ඊ, ඌ, එ

03. එ, ඔ අක්ෂර හ්‍රස්ව ලෙස උච්චාරණය වන්නේ කිනම් අවස්ථාවේදැයි තෝරන්න.

1. එ, ඔ අක්ෂර සංයෝගාක්ෂරයකට පසුව යෙදුණු විට දී ය.
2. එ, ඔ අක්ෂර සංයෝගාක්ෂරයකට මුලින් යෙදුණු විට දී ය.
3. දීර්ඝ අක්ෂරයකට මුලින් යෙදුණු විට දී ය.
4. මහාප්‍රාණාක්ෂරයකට මුලින් යෙදී තිබුණු විට දී ය.

04. අකාරාදි පිළිවෙළ අනුව නිපාත පද නිවැරදිව යෙදී ඇති වර්ණය තෝරන්න.

1. අචිර, අඤ්ඤත්‍ර, අත්‍ර, අධුනා, ආරා 2. අඤ්ඤත්‍ර, ආරා, අධුනා, අත්‍ර, අචිර,
3. අධුනා, අත්‍ර, අචිර, අඤ්ඤත්‍ර, ආරා 4. අත්‍ර, ආරා, අඤ්ඤත්‍ර, අචිර, අධුනා,

05. ද්විකර්මක ධාතු හඳුන්වාදෙන ගාථාවේ දෙවන ගාථා පාදය වන්නේ මින් කුමක් ද?

1. දුහ යාච රුධි පුච්ඡ 2. උභය තෙ ද්විකම්මා
3. භික්ඛ සාසු වචාදයො 4. නී වහ හරාදයො ච

06. "හ" අක්ෂරය උපදින ස්ථානය වන්නේ මෙයින් කුමක් ද?

1. කණ්ඨජ 2. ඔට්ඨජ 3. තාලුජ 4. මුර්ධජ

07. අණු යන පදයට විරුද්ධාර්ථ විශේෂණ පදය වන්නේ.

1. උච්ච 2. ඌන 3. කිස 4. ථූල

08. එග්ගුණ යනු,

1. දුරුතු මාසය වේ. 2. නවම් මාසය වේ. 3. මැදින් මාසය වේ. 4. බක් මාසය වේ.

09. 'ඡත්තිංසාධිකද්විසතෙ' යනු,

1. 236 වේ. 2. 246 වේ. 3. 256 වේ. 4. 266 වේ.

10. 'චූළං' යනු,

1. කෙස් ය.. 3. ලොම් ය. 2. නිය ය. 4. දත් ය.

11. අතීත කිතක පද පමණක් ඇතුළත් වර්ණය තෝරන්න.

1. භින්න, ඡන්න, දීයමාන, දුද්ධ
2. භින්න, ඡන්න, පුණ්ණ, දුද්ධ
3. කාරීයමාන, ඡන්න, පුණ්ණ, දුද්ධ
4. භින්න, වුච්චමාන, පුණ්ණ, දුද්ධ

12. නිර්ධාරණාර්ථයේ යෙදෙන්නේ

1. තතියා-කරණ වේ. 2. පඨමා-අලපන වේ 3. චතුත්ථී-ඡට්ඨී වේ. 4. ඡට්ඨී-සත්තමී වේ.

13. බෝධිවංසය ලිවීම සඳහා ආරාධනා කළ භික්ෂුව වන්නේ,

1. උපතිස්ස තෙරුන් ය.
2. බුද්ධඝෝෂ තෙරුන් ය.
3. පරාක්‍රම සෙන්පතියා ය.
4. දාඨානාග තෙරුන් ය.

14. සත්තමී විභක්ති ප්‍රත්‍යය ඇතුළත් වර්ණය තෝරන්න.

1. සි යො 2. නා හි 3. ස්මිං සු 4. ස නං

15. සන්ධි ප්‍රධාන ප්‍රභේද ගණනින්,

1. 08කි.
2. 05කි.
3. 03කි.
4. 01කි.

16. වොමිස්සක යනු,

1. සමාස ප්‍රභේදයකි.
2. සන්ධි ප්‍රභේදයකි.
3. කෘදන්ත ප්‍රභේදයකි.
4. තද්ධිත ප්‍රභේදයකි.

17. සන්ධි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

1. සුබෝච්චාරණය.
2. ශ්‍රවණ මාධූර්ය.
3. ව්‍යක්ත බව.
4. සුඛාවබෝධය.

18. ලලාට ධාතු වංසය රචනා කර ඇත්තේ .......................... රාජ්‍ය සමයේ දී ය.

1. දුටුගැමුණු 2. සද්ධාතිස්ස 3. වළගම්බා 4. මහසෙන්

19. පාලි වංසකථා අතර ආරම්භක වංසකථාව ලෙස දැක්වෙන්නේ,

1. බුද්ධවංසය 2. දීපවංසය 3. මහාවංසය 4. දාඨාවංසය

20. ක්‍රියා විශේෂණ පද සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?

1. ක්‍රියා විශේෂණ පදය නපුංසක ලිංග දුතියා එකවචන වේ.
2. ක්‍රියා විශේෂණ පද සියලු නාම විභක්තිවල වරනැගිය හැකි වේ.
3. ක්‍රියා විශේෂණ ඇතැම් විට තතියා විභක්ති ඒක වචන වේ
4. ඇතැම් නිපාත පද ද ක්‍රියා විශේෂණ පද ලෙස යෙදිය හැකි වේ.

21. ව්‍යඤ්ජන සන්ධිය ප්‍රභේද ගණනින්

1. 02 කි.
2. 04 කි.

3. 06 කි. 4. 08 කි.

**22. ගාථා 415කින් සැදුම්ලත් වංසකථාව වන්නේ,**

1. බුද්ධවංසය යි. 2. දීපවංසය යි. 3. මහාවංසය යි. 4. දාඨාවංසය යි.

**23. 'ධාතුහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙතුවත්ථෙ' දක්වන්නේ.**

1. ප්‍රයෝජ්‍යාර්ථය 2. නිර්ධාරණාර්ථය
3. ක්‍රියා විශේෂණාර්ථය 4. සහර්ථය

**24. මෑත භාගයේ ලියූ වංසකථාවක් වන්නේ මින් කුමක් ද?**

1. දාඨාවංසය 2. ඡකෙසධාතු වංසය
3. අභිනවසාසනවංසය 4. හත්ථවනගල්ල විහාරවංසය

**25. නොපෙති යන සන්ධි පදය අයත් වන්නේ**

1. අබ්භාදේශයට 2. රිකාරාදේශය 3. අසවර්ණාදේශය 4. යකාරාදේශය

**26. පාලි ථූපවංසයේ ඇතුළත් නොවන සිදුවීමක් වන්නේ මින් කුමක් ද?**

1. බුද්ධ චරිතය පිළිබඳ 2. ථූපාරාමය ඉදිකිරීම පිළිබඳ
3. දස මහායෝධයන් පිළිබඳ 4. පෘතුගීසීන් පැමිණීම පිළිබඳ

**27. පාලි සූත්‍රයට නොගැළපෙන අක්ෂර ප්‍රභේදය තෝරන්න.**

1. තත්‍රෝදන්තා සරා අට්ඨ - ස්වර 2. අං ඉති නිග්ගහීතං - නිග්ගහීත
3. සෙසා බ්‍යඤ්ජනා - මහාප්‍රාණාක්ෂර 4. ළන්තාඤ්ඤෙ සොසා - ඝෝෂාක්ෂර

**28. මහාවංසයේ මුල් කොටසේ ඇති පරිච්ඡේද ගණන වන්නේ,**

1. පරිච්ඡේද 30කි. 2. පරිච්ඡේද 34කි.
3. පරිච්ඡේද 37කි. 4. පරිච්ඡේද 39කි.

**29. නාම පදයක් නොවන ලක්ෂණය ඇති පිළිතුර සහිත වර්ණය තෝරන්න.**

1. යම් දෙයක් 2. යම් කෙනෙක් 3. යම් සිදුවීමක් 4. යම් සංකල්පයක්

**30. සිවුවැනි පැරකුම්බා රාජ්‍ය සමයේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමය දක්වා මහාවංසය ලියූ කතුවරයා වන්නේ,**

1. මහානාම හිමියන් ය.
2. ධර්මකීර්ති මාහිමියන් ය.
3. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ පඬිතුමා ය.
4. තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමියන් ය.

**31. 'උජුජාතිකො සුනඛො' කතාවේ එන බල්ලා විසින් පසේ බුදුරජුන්ට මග කියා දුන් අවස්ථා ගණන වන්නේ ,**

1. 01කි. 2. 02කි. 3. 03කි. 4. 04කි.

**32. ආඛ්‍යාත ප්‍රභේද ගණන නිවැරදිව දැක්වෙන වර්ණය තෝරන්න.**

1. 2කි. 2. 4කි. 3. 6කි. 4. 8කි.

**33. සන්ධි කිරීමේදී භාවිත ක්‍රමෝපායක් නොවන්නේ,**

1. ද්විත්ව යයි. 2. දීර්ඝ යයි. 3. හ්‍රස්ව යයි. 4. පුරුෂ යයි.

**34. නිග්ගහීත සන්ධියට අයත් ආදේශ සන්ධියේ ප්‍රභේද ගණන වන්නේ**

1. 2කි. 2. 4කි. 3. 6කි. 4. 8කි.

**35. ඔ අවස්සෙ යන සූත්‍රානුසාරයෙන් සකස් වූ සන්ධි පදයක් නොවන්නේ,**

1. පරොසහස්සං 2. ඔකාසො. 3. ඔනද්ධා 4. ඔරොහති.

**36. ක්‍රියාව සිදුවීමට ආධාර කරන විභක්තිය වන්නේ,**

1. චතුත්ථී විභක්තිය 2. පඤ්චමී විභක්තිය
3. ඡට්ඨී විභක්තිය 4. සත්තමී විභක්තිය

**37. අතීත කාල (අජ්ජතනී) ක්‍රියා පදය ඇතුළත් වර්ණය තෝරන්න.**

1. වන්දිස්සසි 2. රක්ඛන්ති 3. ඛාදිස්සං 4. හරිංසු

**38. ස්වර සන්ධියේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,**

1. ස්වර ව්‍යඤ්ජනාක්ෂර අතර සන්ධිය සිදුවීම
2. ස්වර නිග්ගීත අතර සන්ධිය සිදුවීම
3. ස්වර අකුරු අතර සන්ධිය සිදුවීම
4. ව්‍යාඤ්ජන ව්‍යඤ්ජන අක්ෂර අතර සන්ධිය සිදුවීම

**39. 'කතඤ්ඤූ සිගාලො' කථාව මගින් ගත හැකි ආදර්ශයක් වන්නේ මෙයින් කුමක් ද?**

1. දැඩි මසුරු බව දුකට හේතු වේ. 2. කළගුණ සැලකීම සත්පුරුෂ ලක්ෂණයක් වේ.
3. අනුන් රවටන්නා කවදා හෝ රැවටේ. 4. දරුවන් කෙරෙහි ආදරයෙන් කටයුතු කළ යුතු වේ.

**40. පාලි මහාවංසයේ ඔබට නිර්දේශිත පරිච්ඡේදය වන්නේ,**

1. තෙවන පරිච්ඡේදය 2. සිවුවන පරිච්ඡේදය
3. පස්වැනි පරිච්ඡේදය 4. සයවැනි පරිච්ඡේදය

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2023**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2023**
**Mid Year Term Test - 2023**

පැය තුනයි

**පාලි ii** විභාග අංකය : ............................................ **4 ශ්‍රේණිය**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද, II කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න**

❖ **මෙම ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.**

## I කොටස

**01.** (අ). පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සිහලදීපෙ කිර දණ්ඩගොණගාමෙ එකො සිගාලො තත්ථ තත්ථ ගොචරං පරියෙසමානො එකං සල්ලකං දිස්වා ගණ්හිතුං ධාවි. තස්මිං ඛණෙ සල්ලො සූචියො විජ්ඣි. තතො එකා සූචි සිගාලස්ස අක්ඛිං භින්දි. තෙන සො ‘කාණසිගාලො’ති පඤ්ඤායි. අපරභාගෙ ගොචරත්ථාය ඉතො චිතො විචරන්තං අජගරො භොගෙන බන්ධි. අථෙකො ගොපාලකො තං අජගරෙන නිප්පිලීයමානං දිස්වා තස්ස කාරුඤ්ඤෙන අජගරෙන සද්ධිං වායමිත්වා තං විස්සජ්ජාපෙසි. අජගරො සිගාලං විස්සජ්ජෙත්වා ගොපාලං ගණ්හි. සිගාලො තං දිස්වා මයා කතඤ්ඤුතා භවිතබ්බන්ති මඤ්ඤමානො...

(ලකුණු 06 යි)

(ආ). පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

ගොචරාය ගතෙ සීහෙ - දක්ඛිණංස්මහි මාතරං,
වාමෙ කනිට්ඨිං කත්වාන - තතො සීසං අපක්කමි.

නිවාසෙත්වාන සාඛාං තෙ - පච්චන්තං ගාම'මාගමුං
තත්ථා'සි රාජධීතාය - මාතුලස්ස සුතො තදා.

සෙනාපති වංගරඤ්ඤෙ - ඨිතො පච්චන්තගාමකෙ
නිසින්නො වටමූලෙ සො - කම්මන්තං සංවිධාපයං.

(ලකුණු 2 x 3 = 6 යි)

02. (අ) පාලියට නගන්න.

i. ඒ කුමාරවරු ඒ කුමාරිකාවන් සමග වනයට පිවිසෙති.
ii. සිල්වත් භික්ෂුව සෑ මළුව හොඳින් අමදියි.
iii. නුඹලා මවුපියන්ට සලකහු. (ලකුණු 06 යි)

(ආ). ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සත්ථවාහකුලෙ පටිසන්ධිං ගහෙත්වා වයප්පත්තො පඤ්චහි සකටසතෙහි වාණිජ්ජං කාරොන්තො විචරති. සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි. තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා මුට්ඨිනා ගහිතා හත්ථෙ න තිට්ඨති. සූරියුග්ගමනතො පට්ඨාය අඞගාරරාසිවිය උණ්හා හොති න සක්කා අක්කමිතුං. තස්මා තං පටිපජ්ජන්තා දරුදකතිලතණ්ඩුලාදිනි සකටෙහි ආදය රත්තිමෙව ගන්ත්වා අරුණුග්ගමණෙ සකටානි පරිවත්තං කත්වා මත්ථකෙ මණ්ඩපං කාරෙත්වා කාලස්සෙව ආහාරකිච්චං නිට්ඨාපෙත්වා ඡායාය නිසින්නා දිවසං ඛෙපෙත්වා අත්ථංගතෙ සූරියෙ සායමාසං භුඤ්ජිත්වා භූමියා සිතලාය ජාතාය සකටානි යොජෙත්වා ගච්ඡන්ති. සමුද්දගමණසදිසමෙව ගමනං

හොති. ථලනියාමකො නාම ලද්ධං වට්ටති. සො තාරකසඤ්ඤාය සත්ථං තාරෙසි.

i. අතීතයේ බරණැස රජකම් කළ රජතුමාගේ නම කුමක් ද?
ii. කාන්තාරයෙන් එතරවෙන අය කවර ලකුණකින් එතර වේ ද?
iii.**'සමුද්දගමණසදිසමෙව ගමනං හොති.'** යන්නෙහි අර්ථය ලියන්න.
iv. කාන්තාරයෙහි වැලි සියුම් බව ජාතක කතාකරු කීවේ කෙසේ ද?

(ලකුණු 1 + 1 + 2 + 2 = 6 යි)

11 කොටස

03. (අ) ''බාලාවතාරය''නැමති ව්‍යාකරණ ග්‍රන්ථය අයත් වන ව්‍යාකරණ සම්ප්‍රදයේ නම කුමක් ද?

(ලකුණු 02)

(ආ) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ස්වර අක්ෂර 10 ක් ඇති බව දක්වන්නේ කුමන පාලි ව්‍යාකරණ සම්ප්‍රදයේ ද?

ii. පාලි ව්‍යාකරණ සම්ප්‍රදය තුන නම්කරන්න.

(ලකුණු 1 + 3 = 04)

(ඉ) පහත සඳහන් බාලාවතාර සූත්‍රවලින් කියවෙන අක්ෂර ලියා දක්වන්න.

i. ලහුමත්තා තයො රස්සා

ii. වග්ගානං පඨමදුතියා සොචාසොසා

iii. ටවග්ගරළා මුද්ධජා (ලකුණු 06)

04. (අ) සර්වනාම පුල්ලිංග 'ඉම' ශබ්දයේ දුතියා, චතුත්ථී විභක්ති ඒකවචන බහුවචන පද ලියන්න.

(ලකුණු 04)

(ආ) පහත සඳහන් වාක්‍යයෙහි **අංකිත පදවල** විභක්තිය ලියන්න.

i. **<u>පුරිසො</u>** **<u>පීඨෙ</u>** නිසීදිත්වා **<u>සුඛෙන</u>** **<u>භත්තං</u>** භුඤ්ජති. (ලකුණු 04)

(ඉ) තතියා හා ජට්ඨී නාම විභක්ති ප්‍රත්‍ය ලියා දක්වන්න (ලකුණු 04)

05. (අ) අණකිරීම හා ආශිර්වාදය යන අර්ථ ප්‍රකාශ කරන ආඛ්‍යාත විභක්තිය නම් කරන්න. (ලකුණු 02)

(ආ) 'සචෙ ත්වං **රොදෙය්‍යාසි** නාහං **කරෙය්‍යාමී**'ති මාතා **අවදි.**' සො තං සාධුකං **සුණි.** යන වැකිවල අංකිත පදයන්හි ආඛ්‍යත විභක්ති නම් කරන්න.
(ලකුණු 04)

(ඉ) **''භූ සත්තායං පච පාකෙ ගමු - සප්ප ගතිම්හිච...''.** මෙහි ඇති එක් ධාතුවක් අජ්ජතනී අඛ්‍යාත, පරස්සපදයේ වරනගන්න. (වගු ගත කිරීම අනිවාර්යයි.) (ලකුණු 06)

06. (අ) පහත සඳහන් පද පාලියෙන් ලියන්න.

i. ඉරිද ii. බදාද (ලකුණු 02)

(ආ) පහත වාක්‍ය පාලියට නගන්න.

i. ශ්‍රද්ධාවන්තයෝ සුදු මලින් නිතර බුදුන් පුදති.

ii. නුඹලා බත පිසහු.

iii. මම හැමදම පිරිවෙනට යමි.

iv සියලු සත්වයෝ සතුටු සිතැත්තෝ වෙත්වා. (ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නො අඩු රචනාවක් ලියන්න.

i. මම පරිවෙණං

ii. සිරිලංකාදීපං

iii. සුනඛො

iv ජයමහාබොධිං (ලකුණු 06)

07. (අ) බාලාවතාරයේ දක්වා ඇති ප්‍රධාන සන්ධි ප්‍රභේද ලියන්න. (ලකුණු 04)

(ආ) පහත සඳහන් විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

i. ජායා + ඉව ii. කිංසු + ඉධ (ලකුණු 04)

(ඉ) පහත දී ඇති සන්ධිපද විසන්ධි කර දක්වන්න.

i. ජානෙමුතං ii. බන්ධුස්සෙව iii. තම්මිත්තං iv. නයිමස්ස (ලකුණු 04)

08. (අ) මෛත්‍රී බුදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වංසකථාවේ නම කුමක් ද?

(ලකුණු 02)

(ආ) මහාවංසය රචනා කිරීමට ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය වූ වංසකථා 02ක් නම් කරන්න.

(ලකුණු 04)

(ඉ) මහාවංසයේ 6 වන පරිච්ඡේදය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

# පාලි

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය



සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Test - 2018

04 වසර / Grade 04

පාලි
**PALI**

කාලය : පැය තුන යි
Time : Three Hours

❖ **I** කොටසේ ප්‍රශ්න සියල්ලට ද **II** කොටසේ 02, 03 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

### I කොටස

**01.** අංක 1 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

01. පාලි අක්ෂර මාලාවේ ඇති අඝෝෂාක්ෂර ගණන
   i. 08 කි.   iii. 13 කි.
   ii. 11 කි.   iv. 21 කි.

02. උගුරෙන් උපදින අකුරු යුගලය ඇතුළත් නිවැරදි වරණය වනුයේ
   i. ක, හ   ii. ක, ජ   iii. ජ, න   iv. ඨ, ඪ

03. අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වරණය වනුයේ
   i. පුරිසදම්මසාරථී, ඵුස්සමාස, පන්නරසි, ඡායා
   ii. පුරිසදම්මසාරතී, ඵුස්සමාස, පණ්ණරසි, ඡායා
   iii. පුරිසධම්මසාරථී, ඵුස්සමාස, පණ්ණරසි, චායා
   iv. පුරිසදම්මසාරථී, ඵුස්සමාස, පණ්ණරසි, ඡායා

04. ධම්ම, කම්ම, විහාර, ආකාස යන ශබ්ද වරනැඟීම් රටාව අනුව
   i. පුල්ලිංග වේ.   iii. නපුංසක ලිංග වේ.
   ii. පුමනපුංසක ලිංග වේ.   iv. පුම්ත්ථිලිංග වේ.

05. 'ගුණවන්තු' ශබ්දයේ චතුත්ථී විභක්ති බහුවචන රූපය කුමක් ද?
i. ගුණවතො   ii. ගුණවන්තං   iii. ගුණවන්තානං   iv. ගුණවන්තෙහි

06. වාක්‍යයක යොදන විශේෂ්‍ය - විශේෂණ පද පිළිබඳ සම්මත පාලි රීතිය වනුයේ
   i. හැමවිටම ලිංගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් සමාන විය යුතුය.
   ii. ඇතැම්විට ලිංගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් සමාන විය යුතුය.
   iii. හැමවිටම විභක්තියෙන්, වචනයෙන් පමණක් සමාන විය යුතුය.
   iv. බොහෝ විට ලිංගයෙන්, විභක්තියෙන් සමාන විය යුතුය.

07. ක්‍රියාවක මූලය හඳුන්වනුයේ
   i. ආඛ්‍යාතය යනුවෙනි.   iii. ධාතුව යනුවෙනි.
   ii. ශබ්ද ප්‍රකෘතිය යනුවෙනි.   iv. කාරක යනුවෙනි.

08. අජ්ජතනී ආඛ්‍යාත උත්තම පුරිස ඒකවචන රූපය කුමක් ද?

i. අපචී ii. අපචිං iii. අපචිංසු iv. අපචූ

09. '1823' යන සංඛ්‍යාව පාලියෙන් ලියා ඇති නිවැරැදි වරණය කුමක් ද?

i. එකසහස්සාධික-අට්ඨසතුත්තර-තෙවීසතිං

ii. තෙවීසත්‍යාධික-අට්ඨසතුත්තර-සහස්සං

iii. සහස්සුත්තර-අට්ඨසත-තෙවීසති

iv. තෙවීසති-අට්ඨසත-එකසහස්සං

10. කාලාර්ථවාචී නිපාත පද ඇතුළත් යුගලය

i. එකදා - අධුනා ii. කතිධා - එකදා iii. සබ්බත්ථ - සමන්තා iv. අධුනා - සබ්බත්ථ

11. 'එ'කාරයට යකාරාදේශයක් සිදුවන බාලාවතාර සූත්‍රය වනුයේ

i. යමෙදන්තස්සාදෙසො

ii. ඉවණ්ණො යං නවා

iii. යවමදනතරළාචාගමා

iv. එහෙඤ්ඤං

12. මහප්‍රාණ අක්ෂරයන්ට අල්පප්‍රාණ අක්ෂර ද්විත්වවීමේ කාර්යය සිදුවන බාලාවතාර සූත්‍රය කුමක් ද?

i. පරද්වෙභාවො ඨානෙ

ii. බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො

iii. වග්ගෙ ඝොසා'ඝොසානං තතියපඨමා

iv. සයෙච

13. සමාස පදවල පවත්නා මූලික ලක්ෂණයක් **නො** වන්නේ

i. නාමයක් හා ආඛ්‍යාත පදයක් සමාස වීම

ii. පද කෙටිවීම

iii. එක් පදයක් බවට පත්වීම

iv. එක් විභක්ත්‍යන්ත පදයක් බවට පත්වීම

14. 'මාතාපිතරො' යන පදය අයත් වනුයේ

i. කම්මධාරය සමාසයට ය.

ii. දිගු සමාසයට ය.

iii. තප්පුරිස සමාසයට ය.

iv. ද්වන්ද සමාසයට ය.

15. තප්පුරිස සමාසය සඳහා උදාහරණයක් ලෙස යෙදිය හැකි පදය කුමක් ද?

i. චතුද්දිසං

ii. ජිනචරිතං

iii. ජිතින්ද්‍රියො

iv. පාවචනං

16. පාලි භාෂාවේ සමාස ප්‍රභේද ගණන

i. 4 කි. ii. 5 කි. iii. 6 කි. iv. 8 කි.

17. තද්ධිත සම්බන්ධයෙන් නිවැරැදි ප්‍රකාශය වන්නේ

i. නාමයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදේ.

ii. ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදේ.

iii. නාම පද දෙකක් එකතු වීමෙන් සෑදේ.

iv. තද්ධිත පදවල ආදිස්වර වෘද්ධිය සිදු නො වේ.

18. සකට + ණික යන්නෙහි නිවැරැදි තද්ධිත පදය කුමක් ද?

i. සකටික ii. සකටණික iii. සාකටික iv. සාටික

19. මහාවංසයේ පළමු කොටසේ කතුවරයා වනුයේ

i. ධර්මකීර්ති මාහිමි

ii. මහානාම මාහිමි

iii. ශාරිපුත්‍ර මාහිමි

iv. මහාකාශ්‍යප මාහිමි

20. <u>සාමණෙරො</u> පොත්ථකං පඨති යන වැකියේ අංකිත පදය

i. සමාස පදයකි.
ii. සන්ධි පදයකි.
iii. තද්ධිත පදයකි.
iv. කෘදන්ත පදයකි.

(ලකුණු - 2 x 20 = 40)

## II කොටස

02. අ. පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සීහලදීපෙ කිර දණ්ඩගොණගාමෙ එකො සිගාලො තත්‍ථ තත්‍ථ ගොචරං පරියෙසමානො එකං සල්ලකං දිස්වා ගණ්හිතුං ධාවි. තස්මිං ඛණෙ සල්ලො සූචියො විජ්ඣි. තතො එකා සූචි සිගාලස්ස අක්ඛිං භින්දි. තෙන සො 'කාණසිගාලො'ති පඤ්ඤායි. අපරභාගෙ ගොචරත්‍ථාය ඉතො චිතො විචරන්තං අජගරො භොගෙන බන්ධි. අථෙකො ගොපාලකො තං අජගරෙන නිප්පීලියමානං දිස්වා තස්ස කාරුඤ්ඤෙන අජගරෙන සද්ධිං වායමිත්‍වා තං විස්සජ්ජාපෙසි. අජගරො සිගාලං විස්සජ්ජෙත්‍වා ගොපාලං ගණ්හි. සිගාලො තං දිස්වා මයා කතඤ්ඤුනා භවිතබ්බන්ති මඤ්ඤමානො අජගරස්ස භොගෙ තත්‍ථ තත්‍ථ ඩසන්තො සද්දං කරොන්තොපි තං විස්සජ්ජාපෙතුමසක්කොන්තො සමීපඛෙත්තෙ කසන්තෙ මනුස්සෙ දිස්වා සීඝසීඝං තත්‍ථ ගන්ත්වා සද්දං කත්‍වා තත්‍ථ ඨපිතං එකං වත්‍ථං ඩසිත්‍වා ධාවි. මනුස්සා සද්දායන්තාපි වත්‍ථං පාතෙතුං අසක්කොන්තා ලෙඩ්ඩුදණ්ඩාදිහත්ථා තං අනුබන්ධිංසු. සිගාලො අජගරස්ස සමීපෙ වත්‍ථං පාතෙත්‍වා පටික්කම්ම අට්ඨාසි. මනුස්සා අජගරං ච ගොපාලං ච දිස්වා අජගරං මාරෙත්‍වා ගොපාලං විස්සජ්ජාපෙසුං.

(ලකුණු - 9)

ආ. පහත සඳහන් පාලි ගාථා සිංහලට නඟන්න.

සීහො සීඝං ගුහං ගන්ත්වා - තෙ අදිස්වා තයො ජනෙ
අට්ටිතො පුත්තසොකෙන - න ච ඛාදි න චාපිවි.

දාරකෙ තෙ ගවෙසෙන්තො - අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො'ව - යං යං ගාමමුපෙති සො

පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං,
'සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය'

(ලකුණු - 2 x 3 = 6)

03. අ. පහත වාක්‍ය පාලියට නඟන්න.

i. රාහුල කුමාරයා කුඩා වියේ දී ම රහත් විය.
ii. ඔහු විහාරයට ගොස් බුදුන් වැඳ නැවත ගෙට එයි.
iii. පමාවීම මරණයට හේතු වේ. නොපමාව නිවනට හේතු වේ.

(ලකුණු - 3 x 3 = 9)

ආ. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එකස්මිං කිර සමයෙ ලංකායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූලුපට්ඨාකො අබ්භන්තරිකො හුත්‍වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගලඤ්ච ආලානඤ්ච භින්දිත්‍වා පාචීනපස්සං ගන්ත්‍වා වනං පවිසිත්‍වා කිසලපත්තාදයො ඡින්දිත්‍වා භින්දිත්‍වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්‍වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං එලාඑලාදයො ආහරිත්‍වා උපට්ඨානං කරොන්තො විහාසි.

i. දුටුගැමුණු රජුගේ ඇතාගේ නම කුමක් ද?

ii. ඇතා නැගෙනහිර දෙසට ගියේ කුමක් බිඳගෙන ද?

iii. ඇතා උපස්ථාන කළේ කවර භික්ෂු පිරිසකට ද?

iv. 'වාරණො' යන්නට තවත් සමාන පද දෙකක් ලියන්න.

(ලකුණු - 1 + 1 + 2 + 2 = 6)

04. i. පාලි රීතියට අනුව විශේෂණ විශේෂ්‍ය පද අතර පවත්නා සම්බන්ධය හඳුන්වා දෙන්න.

ii. අලිංග නාම පද 04 ක් ලියන්න.

iii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | දුතියා විභක්තිය | | චතුත්ථී විභක්තිය | | සත්තමී විභක්තිය | |
|---|---|---|---|---|---|---|
| පුල්ලිංග 'බලවන්තු' | බලවන්තං | | | | | |
| ඉත්ථිලිංග 'එත' | | | | එතාසානං | | |
| නපුංසකලිංග 'ඉම' | ඉදං, ඉමං | | | | | එසු, ඉමෙසු |

(ලකුණු - 4 + 4 + 7 = 15)

05. i. අනුමති සහ පරිකල්පනාර්ථයේ යෙදෙන ආඛ්‍යාතය කුමක් ද?

ii. අතීත කාලය හැඟවීමට යෙදෙන ආඛ්‍යාත 03 නම් කරන්න.

iii. 'පච' ධාතුව පඤ්චමී ආඛ්‍යාත **පරස්සපදයේ** හා **අත්තනොපදයේ** වරනඟා වගුගත කර දක්වන්න.

(ලකුණු - 2 + 4 + 9 = 15)

06. i. පද සමාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

ii. කම්මධාරය සමාසයේ ප්‍රභේද 05 ක් නම් කරන්න.

iii. පහත දැක්වෙන පද අයත් සමාස වර්ගය ලියා දක්වන්න.

අ. නීලුප්පලං　　ආ. සාරිපුත්තත්ථෙරො
ඉ. තිලොකං　　ඊ. ජිනචරිතං
උ. සමණබ්‍රාහ්මණා　　ඌ. චොරභයං
එ. උපනගරං　　ඔ　ආරුළ්හවාණිජා

(ලකුණු - 2 + 5 + 8 = 15)

07. i. මහාවංසයට පෙර ලියා ඇති වංසකථා 02 ක නම් ලියන්න.

ii. මහාවංසයේ කතුවරුන් තිදෙනෙකු පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. පාලි වංසකථා රචනා කිරීමේ අරමුණු කවරේදැයි කෙටියෙන් පහදන්න.

(ලකුණු - 2 + 6 + 7 = 15)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | # මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2019<br># Primary Piriven Last Term Test - 2019<br>04 ශ්‍රේණිය / Grade 04 |

පාලි
**PALI**

කාලය : පැය තුනයි
Time : Three Hours

- ❖ **I කොටසටත්** II කොටසින් 02, 03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

## I කොටස

**01 අංක 01 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01. තල්ලෙන් උපදින අකුරු යුගලය ඇතුළත් නිවැරදි වරණය වනුයේ
    1. ච, ද  2. ඡ, ය  3. ක, ඝ  4. ඉ, හ

02. පාලි වංසකථා සාහිත්‍යයේ ආරම්භක කෘතිය වනුයේ,
    1. ථූපවංසයයි.  2. අනාගතවංසයයි.  3. බුද්ධවංසයයි.  4. මහාවංසයයි.

03. **'කතො'** යන පදය අයත් වන්නේ පහත දැක්වෙන කවර කිතක ප්‍රභේදයට ද?
    1. වර්තමාන කිතක  2. අතීත කිතක
    3. අනාගත කිතක  4. ත්‍රෛකාලික කිතක

04. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. කිතක පදවල පුරුෂ භේදයක් ඇත.  2. කිතක පද ලිංග භජනය නො කරයි.
    3. කාලාර්ථයක් ප්‍රකාශ නො වේ.  4. කිතක පද ලිංග භජනය කරයි.

05. පාලි අක්ෂර මාලාවේ ඇති ඝෝෂාක්ෂර ගණන
    1. 08 කි.  2. 11 කි.  3. 12 කි.  4. 21 කි.

06. **භගවා භික්ඛූනං ධම්මං දෙසෙසි** ' යන්නෙහි නිවැරදි කර්මකාරක වාක්‍යය තෝරන්න.
    1). භගවතා භික්ඛූනං ධම්මො දෙසිතො.  2). භගවන්තෙන භික්ඛූනං ධම්මං දෙසිතං.
    3). භගවතා භික්ඛූනං ධම්මො දෙසීයති.  4). භගවන්තෙන භික්ඛුං ධම්මං දෙසෙසි.

07. පාලි භාෂාවේ තද්ධිත ප්‍රභේද ගණන
    1. හතරකි.  2. පහකි.  3. හයකි.  4. අටකි.

08. ධම්මරතො යන සමාස පදය අයත් වනුයේ
    1. දුතියා විභක්ති තප්පුරිස සමාසයට ය.
    2. තතියා විභක්ති තප්පුරිස සමාසයටය.
    3. පඤ්චමී විභක්ති තප්පුරිස සමාසයටය.
    4. සත්තමී විභක්ති තප්පුරිස සමාසයටය.

09. පාලි භාෂාවේ කම්මධාරය සමාසයේ ප්‍රභේද ගණන

1. 05 කි. 2. 06 කි. 3. 08 කි. 4. 09 කි.

10. ස්වරයා පරකල්හි නිග්ගහීතය ලොප් වීමේ කාර්යය සිදුවන බාලාවතාර සූත්‍රය කුමක්ද?

1. ක්වචි ලොපං 2. පරො වා සරො
3. ලොපඤ්ච තත්‍රාකාරො 4. සරා සරෙ ලොපං

11. **යවමදනතරලා චාගමා** යන බලාවතාර සූත්‍රයට අදාළ උදාහරණයක් **නොවන්නේ** මේවායින් කුමක්ද?

1. නිරුපද්දවං 2. සෙතච්ඡත්තං 3. පුථගෙව 4. ඉධමාහු

12. වර්ගාන්තාක්ෂර හැඳින්වීමට අපර නාමයක් වන්නේ,

1. සිථිලාක්ෂර යන්න යි. 2. ඝෝෂාක්ෂර යන්න යි.
3. ඌෂ්මාක්ෂර යන්න යි. 4. අනුනාසිකාක්ෂර යන්න යි.

13. කත්තික යන්නෙන් නම් කෙරෙනුයේ කවර මාසය ද?

1. වප් 2. ඔක් 3. බිනර 4. ඉල්

14. **අජ්ජතනී** ආඛ්‍යාත කත්තරි අත්තනොපද පඨමපුරිස බහුවචන රූපය කුමක්ද?

1. අපචූ 2. අපචුං 3. අපච 4. අපචිං

15. පහත පද අතුරින් යුගල පදයක් නොවන්නේ කුමන පදය ද?

1. වාතාතපං 2. බයවයං 3. එත්තාවතා 4. පුත්තදාරං

16. **වෙන්වීම** අර්ථය ප්‍රකාශ කරන විභක්තිය වන්නේ

1. චතුත්ථී 2. පඤ්චමී 3. ඡට්ඨී 4. සත්තමී

17. පාලි බෝධිවංසයේ පරිච්ඡේද ගණන වන්නේ

1. නවයකි. 2. දහයකි. 3. එකොළොසකි. 4. දොළොසකි.

18. **අධුනා (දැන්)** යන නිපාත පදයේ අර්ථයට සමාන අර්ථ සහිත නිපාත පදය වන්නේ

1. එතරහි 2. අද්ධා 3. ආරා 4. ධුවං

19. ද්විලිංග නාමයක් නොවන්නේ කවර වරණයද?

1. නගර 2. ධම්ම 3. චිත්ත 4. යට්ඨි

20. පහත වාක්‍ය අතරින් කර්මකාරක වාක්‍ය තෝරන්න.

1. සීහො මිගෙන සද්ධිං කීළති. 2. චොරෙන ගොණො චොරීයති.
3. පුරිසො එකං වස්සං යාචි. 4. මයං භණ්ඩානි කිණිස්සාම.

(ලකුණු 2×20 =40)

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අතීතෙ ජම්බුදීපෙ අජිතරට්ඨෙ එකො ගොපාලකො වසි. තස්ස ගෙහෙ එකො පච්චෙකබුද්ධො නිබද්ධං භුඤ්ජති. තස්මිං ගෙහෙ එකො කුක්කුරො ච අහොසි. පච්චෙකබුද්ධො භුඤ්ජන්තො තස්ස නිබද්ධං එකං භත්තපිණ්ඩං අදාසි. සො තෙන පච්චෙකබුද්ධෙ සිනෙහමකාසි. ගොපාලකො දිවසස්ස ද්වෙ වාරෙ පච්චෙකබුද්ධස්ස උපට්ඨානං ගච්ඡි. සුනඛොපි තෙන සද්ධිං ගච්ඡි. ගොපාලො එකදිවසං පච්චෙකබුද්ධං ආහ. භන්තෙ යදා මෙ ඔකාසො න භවිස්සති, තදා ඉමං සුනඛං පෙසෙස්සාමි. තෙන සඤ්ඤානෙන ආගච්ඡෙය්‍යාථාති. තතො පට්ඨාය අනොකාසදිවසෙ සුනඛං පෙසෙසි. සො එකවචනෙනෙව පක්ඛන්දිත්‍වා පච්චෙකබුද්ධස්ස වසනට්ඨානං ගන්ත්‍වා තික්ඛත්තුං භුස්සිත්‍වා අත්තනො ආගතභාවං ජානාපෙත්‍වා එකමන්තං නිපජ්ජි. පච්චෙකබුද්ධෙ වෙලං [illegible] නික්ඛන්තෙ භුස්සන්තො පුරතො ගච්ඡි. පච්චෙකබුද්ධො තං වීමංසන්තො එකදිවසං අඤ්ඤං මග්ගං පටිපජ්ජි. අථ සුනඛො පුරතො තිරියං ඨත්‍වා භුස්සිත්‍වා ඉතරමග්ගමෙව නං ආරොපෙසි.

(ලකුණු 9)

(ආ) පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

අග්ගහි නතියෙ වාරෙ - සීහබාහු අපුච්ඡිය,
මාතරං තිසහස්සං තං - සාතෙතුං පිතරං සකං.

රඤ්ඤො කුමාරං දස්සෙසුං - තං රාජා ඉද'මබ්‍රවි,
"ගහිතො යදි සීහො තෙ - දම්මි රට්ඨං තදෙව තෙ"

සො තං ගන්ත්‍වා ගුහාද්වාරං - සීහං දිස්වා'ව ආරකා,
එන්තං පුත්තසිනෙහෙන - විජ්ඣිතුං තං සරං ඛිපි.

(ලකුණු 6)

(03) (අ) පහත වාක්‍ය පාලියට නගන්න.

(i) යමෙක් ධර්මය දකී ද හේ මා දකී.

(ii) මම හැමදා ම පිරිවෙණට යමි.

(iii) ගුණවත් උපාසිකාව සිල්වත් භික්ෂුවට නිතර දන් දෙයි.

(ලකුණු 9)

(ආ) ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහමදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සත්ථවාහකුලෙ පටිසන්ධිං ගහෙත්‍වා වයප්පත්තො පඤ්චහි සකටසතෙහි වණිජ්ජං කරොන්තො විචරති. සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි. තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා මුට්ඨිනා ගහිතා හත්ථෙ න තිට්ඨති. සුරියුග්ගමනතො පට්ඨාය අඞ්ගාරරාසි විය උණ්හා හොති න සක්කා අක්කමිතුං. තස්මා තං පටිපජ්ජන්තා දාරුදකතිලතණ්ඩුලාදීනි සකටෙහි ආදාය රත්තිමෙව ගන්ත්‍වා අරුණුග්ගමණෙ සකටානි පරිවත්තං කත්‍වා මත්ථකෙ මණ්ඩපං කාරෙත්‍වා කාලස්සෙව ආහාරකිච්චං නිට්ඨාපෙත්‍වා ඡායාය නිසින්නා දිවසං ඛෙපෙත්‍වා අත්ථං ගතෙ සූරියෙ සායමාසං භුඤ්ජිත්‍වා භූමියා සීතලාය ජාතාය සකටානි යොජෙත්‍වා ගච්ඡන්ති. සමුද්දගමනසදිසමෙව ගමනං හොති. ථලනියාමකො නාම ලද්ධුං වට්ටති. සො තාරකසඤ්ඤාය සත්ථං තාරෙසි.

(i) කාන්තාරයෙහි වැලි සියුම් බව ජාතකකරු කීවේ කෙසේ ද?

(ii) ඡේදයෙහි එන උපමා පද දෙකක් උපුටා ලියන්න.

(iii) **සකටානි පරිවත්තං කත්වා** යන්නේ තේරුම ලියන්න.

(iv) දවල් කාලයෙහි වෙළෙන්දෝ කාන්තාරයේ වාසය කළේ කෙසේ ද?

(ලකුණු 1+2+2+1= 6)

(04) (i) නාමපද හඳුන්වා, නාම ප්‍රභේද නම් කරන්න.

(ii) උකාරාන්ත ඉත්ථි ලිංග නාමපද 06ක් ලියන්න.

(iii) පහත නාමයන්හි **චතුත්ථි** හා **සත්තමී** විභක්තිවල ඒකවචන හා බහුවචන වරනැගීම ලියා දක්වන්න.

(අ). අම්හ (ආ). යක්ඛ (ඉ). මුනි (ඊ). මන

(ලකුණු 4+ 3+ 8 = 15)

(05) (i) අණ කිරීම හා ආශිර්වාද කිරීම යන අර්ථයන්හි යෙදෙන ආඛ්‍යාතය නම් කරන්න.

(ii) 565, 750, 2525, යන ඉලක්කම් පාලියෙන් ලියා දක්වන්න.

(iii) පච ධාතුව සත්තමී ආඛ්‍යාත කත්තුකාරක පරස්සපදයේ හා අත්තනොපදයේ වරනගන්න.

(ලකුණු 1+6+8 = 15)

(06) (i) සන්ධි කිරීමෙන් භාෂාවට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.

(ii) පහත සූත්‍රවලට උදාහරණය බැගින් ලියන්න.

අ. වමොදුදන්තානං

ආ. සරා සරෙ ලොපං

ඉ. යවමදනතරළාචාගමා

ඊ. වග්ගන්තං වා වග්ගෙ

උ. මදාසරෙ

(iii) පහත සමාසපද අයත් වන සමාසය නම් කරන්න.

අ. සීලධනං ආ. අනුථෙරං

ඉ. විජිතමාරො ඊ. චන්දසූරියා

උ. තිලොකං ඌ. පාවචනං

එ. මාතාපිතරො ඔ. අසුරො

(ලකුණු 2 +5 + 8 =15)

(07) (i) පාලි වංසකථා 04ක් නම් කරන්න.

(ii) පාලි වංසකථා රචනා කිරීමේ අරමුණු කෙටියෙන් පහදන්න.

(iii) පහත ගාථා සම්පූර්ණ කරන්න.

1. උච සද්දෙ සමවායෙ

2. සු සවනෙ සක සත්තිම්හි

(ලකුණු 2 +5 + 8 =15)

| | | |
|---|---|---|
| (සියලු ම හිමිකම් ඇවිරිණි) (All Rights Reserved) | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020** | |
| | Primary Piriven Year End Test - 2020 | |
| | 4 ශ්‍රේණිය / Grade 4 | |
| පාලි I | | කාලය : පැය එක යි |
| **Pali I** | විභාග අංකය :- ……………. | Time : One hour |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. කච්චායන සම්ප්‍රදායට අනුව පාලි වර්ණ මාලාවේ අක්ෂර ගණන,
   1. 40 කි. 2. 41 කි. 3. 42 කි. 4. 43 කි.

02. උගුර හා තල්ල (කණ්ඨ තාලුජ) යන දෙතැනම ස්පර්ෂ වීමෙන් උපදින අකුරකි.
   1. එ 2. ඔ 3. ව 4. ය

03. වර්ගාන්තාක්ෂර නිවැරදිව යෙදී **නොමැති** වචනය වන්නේ,
   1. සඤ්ජාතො 2. සණ්ඨිතො 3. කිඤ්කතො 4. සඤ්ඤොගො

04. ප්‍රශ්නවාචී සර්වනාම පදයක් **නො වන්නේ** මින් කුමක් ද?
   1. කති. 2. කීව. 3. කුත්‍ර. 4. කතම.

05. සංඛ්‍යාවාචී ''චතු'' ශබ්දයෙහි නපුංසක ලිංග පඨමා විභක්ති පදය වන්නේ,
   1. චත්තාරො 2. චත්තාරි 3. චතුරො 4. චතස්සො

06. පහත සඳහන් ආඛ්‍යාත පද අතුරෙන් පඤ්චමී මධ්‍යම පුරුෂ ඒක වචනය වන්නේ,
   1. පස්ස 2. පචතු 3. ගච්ඡාමි 4. භවන්තු

07. මේ අතරින් ස්ත්‍රී ලිංගික නාමයක් වන්නේ කුමක් ද?
   1. අත්ත 2. පුඤ්ඤ 3. අම්බු 4. කුසුම

08. තද්ධිත නාම පදයක් නොවන්නේ මින් කුමක්ද?
   1. භගවා 2. යසවා 3. බලවා 4. අථවා

09. චුරාදි ගණික ආඛ්‍යාත පදය මින් කුමක් ද?
   1. දෙසෙති 2. භුඤ්ජති. 3. තප්පති. 4. කරොති.

10. නාම කොටස් හයකි. ඉන් ''**ගුණ නාම**'' ගණයට අයත් පද ඇති වරණය වන්නේ,
   1. රාජ, මනුස්ස, ඉත්ථි, පක්ඛි 2. උදක, කුප, වත්ථ, පීඨ 3. ධම්ම, කම්ම, රම්ම, චම්ම 4. සෙත, කණ්හ, උච්ච, ථූල

11. ඊ, උං, ඕ, ත්‍ථ, ඉං, ම්හා යන ප්‍රත්‍යයන්ගෙන් අවසන් වන ආඛ්‍යාත පද අයත් ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. පඤ්චමී 2. සත්තමී 3. අජ්ජතනී 4. කාලාතිපත්ති

12. ස + පුරිස- සප්පුරිස ලෙස සන්ධි වීමේ දී බලපාන බාලාවතාර නීතිය දැක්වෙන සූත්‍රය වන්නේ,

1. පරද්වේභාවොඨානෙ
2. ලොපඤ්චතත්‍රාකරො
3. පරො වා සරො
4. යමෙදන්තස්සාදෙසො

13. ''ඉදනි'' (දැන්) යන අදහස දෙන සමානාර්ථවත් නිපාත පදයක් වන්නේ,

1. සම්පති
2. අථවා
3. උදහු
4. අභිණ්හං

14. ''වා පරො අසරූපා'' යන සූත්‍රයෙන් සිදු වී ඇති සන්ධි පදය මින් කුමක් ද?

1. මාතුපට්ඨානං 2. ඡායාව 3. ඔනද්ධා 4. පච්චන්තං

15. කම්මධාර සමාස පද පමණක් ඇති වරණය මින් කුමක් ද?

1. මහාමති, අකුසලං, සද්ධාධනං, නීලුප්පලං
2. උපනගරං, අනුවාතං, යථාකම්මං, දිට්ඨධම්මො
3. ධම්මරතො, තිභවා, සුගන්ධො, ගාමගතො
4. චොරභයං, මාතාපිතරො, සුරනරො, පුබ්බාපරං

16. ''පිළිකුල් කරන ලද්දේ'' යන අදහස දෙන පාලි වචනය තෝරන්න.

1. කුච්ඡිතො 2. පීළිතා 3. ජිගච්ඡා 4. පටිච්චා

17. වංගෙසු වංග නගරෙ - වංගරාජා අහු පුරෙ
කාලිංග රඤ්ඤො ධීතාසි - ............................ යන ගාථාවේ හිස්තැන පිරවීමට යෙදිය යුතු පද පේළිය සොයන්න.

1. ලජ්ජාසි ජිගුච්ඡිතා
2. මහෙසී තස්ස රාජිනො
3. රාජධීතා ජනෙසි සා
4. ධීතරං සීහසීවලිං

18. මහානාම හිමියන් විසින් රචිත මහාවංශයෙහි පළමු පරිච්ඡේදය වන්නේ,

1. මහාසම්මතවංසං
2. විජයාගමනං
3. මහියඞ්ගනාගමනං
4. නානාදෙසපසාදෙ

19. ගද්‍යයෙන් රචිත එකම වංසකථාව වන්නේ,

1. දීපවංසය යි
2. මහාවංසයයි
3. ථූපවංසයයි
4. මහාබොධිවංසයයි

20. ''නිබ්භිජ්ජ නික්ඛමි'' යන වාක්‍යාංශයේ අර්ථය කුමක් ද?

1. සිදුරු කරගෙන නික්මුණේය.
2. පසුකරගෙන ගියේය.
3. මරාදමමින් නික්මුණේය.
4. බාධක හැර නික්මුණේය.

21. අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං .................................. අහොසි. මෙම වාක්‍යයෙහි හිස්තැන්වලට ගැළපෙන වචන දෙක තෝරන්න.

1. බ්‍රහ්මදත්තො රාජො
2. බ්‍රහ්මදත්තො රාජා
3. බ්‍රහ්මදත්තං රඤ්ඤං
4. බ්‍රහ්මදත්තො රඤ්ඤො

22. "බුද්ධො ධම්මං දෙසෙති. " මෙම වාක්‍ය කර්මකාරකයට හැර වූ පසු

1. බුද්ධො ධම්මං දෙසීයති
2. බුද්ධෙන ධම්මං දෙසිතො
3. බුද්ධෙන ධම්මො දෙසීයති
4. බුද්ධෙන ධම්මො දෙසෙති

23. "මයි ගාමං ගච්ඡන්තෙ " මෙම වාක්‍ය ඛණ්ඩයෙහි නිවැරදි අර්ථය ඇති වරණය තෝරන්න.

1. මම ගමට යන්නෙමි
2. මා ගමට යන කල්හි
3. මා ගමට ගිය කල්හි
4. මම ගමට යන්නෙමි

24. නමො, සොත්ථි යන නිපාත පද යොදනු ලබන්නේ,

1. චතුත්ථී විභක්තිය සමග ය.
2. තතියා විභක්තිය සමග ය.
3. ඡට්ඨී විභක්තිය සමග ය.
4. පංචමී විභක්තිය සමග ය.

25. "ගුළමණ්ඩලෙ " යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

1. කුඹි ගුළෙහි 2. ක්‍රීඩා පිට්ටනියෙහි 3. ගුරු මණ්ඩලයෙහි 4. ගුලි සාදන ස්ථානය

26. ත්‍යජ්ජ මෙහි නිවැරදි විසන්ධිය වන්නේ,

1. තෙ + අජ්ජ 2. ති + අජ්ජ 3. ත්‍ය + අජ්ජ 4. තෙන + ජ්ජ

27. පරස්වර ලෝපය පිළිබඳ ඉගැන්වෙන බාලාවතාර සූත්‍රය තෝරන්න.

1. සරා සරෙ ලොපං 2. වා පරො අසරූපා 3. නයෙ පරං යුත්තෙ 4. වමොදුදන්තානං

28. "මනාකොට " යන අර්ථය ඇති නිපාත පදය තෝරන්න.

1. විසුං 2. සමං 3. සමන්තා 4. සාධුකං

29. "අච්චන්තං " මෙම පදයෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.

1. අචි + අන්තං 2. අත්‍ය + අන්තං 3. අති + අන්තං 4. අච්ච + න්තං

30. තප්පුරිස සමාස පදයකට උදාහරණයකි.

1. චන්දසූරියා 2. ජිනවචනං 3. කණ්හසප්පො 4. සුභික්ඛං

31. "සූකරික " යන පදය

1. සන්ධි පදයකි. 2. සමාස පදයකි. 3. අව්‍ය පදයකි. 4. තද්ධිත පදයකි.

32. "චතුත්ථං ච නිධාපෙය්‍ය " මෙහි ඉරි ඇඳි පදය

1. භාවාර්ථ තද්ධිත පදයකි.
2. සංඛ්‍යා තද්ධිත පදයකි.
3. අනේකාර්ථ තද්ධිත පදයකි.
4. අත්‍යර්ථ තද්ධිත පදයකි.

33. පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය වන්නේ,

1. අනාගතවංසයයි.
2. මහාවංසය යි.
3. දීපවංසයයි.
4. බුද්ධවංසයයි.

34. පාලි බෝධිවංසයෙහි කතුවරයා වන්නේ,

1. දාඨානාග තෙර
2. උපතිස්ස තෙර
3. වාචිස්සර තෙර
4. මහානාම තෙර

35. මහාවංසයෙහි 37 වන පරිච්ඡේදයේ 52 වන ගාථාවේ සිට 79 වන පරිච්ඡේදය දක්වා කොටස රචනා කරන ලද්දේ,

1. මහානාම හිමියන් විසිනි.
2. ධර්මකීර්ති හිමියන් විසිනි.
3. උපතිස්ස හිමියන් විසිනි.
4. වාචිස්සර හිමියන් විසිනි.

36. සො දුක්ඛිතො **කසිරෙන** පුත්තදාරෙ පොසෙති. යන්නෙහි අංකිත පදයේ අර්ථය වන්නේ

1. දුකසේ
2. ගොවිතැනින්
3. කරදර කරමින්
4. කපටිකමින්

37. මට්ටකුණ්ඩලීට පාණ්ඩු රෝගය සෑදෙන විට වයස කීය ද?

1. අවුරුදු 12කි.
2. අවුරුදු 13 කි.
3. අවුරුදු 15 කි.
4. අවුරුදු 16 කි.

38. පා රක්ඛණම්හි පා පානෙ............................ මෙම ගාථාවෙහි අවසාන පාදය කුමක් ද?

1. අථො යා පාපුණෙ සියා යන්න යි.
2. ජී ජයෙ ඤා'වබොධනෙ යන්න යි.
3. භුජ පාලනභොජනෙ යන්න යි.
4. බන්ධනෙ මකි මණ්ඩණෙ යන්න යි.

39. "තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා මුට්ඨිනා ගහිතා හත්ථෙ න තිට්ඨති." මෙම වාක්‍යයෙහි **මුට්ඨිනා** යනු,

1. මුට්ටියෙන්
2. මිටින්
3. සියුම්
4. මිටියෙන්

40. සෙන්පතියා යන අරුත ඇති පාලි වචනය තෝරන්න.

1. ධජිනීපති
2. පිතුච්ඡා
3. විම්හිතො
4. කප්පයී

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

## Primary Piriven Year End Test - 2020

4 ශ්‍රේණිය / Grade 4

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

පාලි II
**Pali II** විභාග අංකය :- ...................

කාලය : පැය තුන යි
Time : Three hours

❖ **I** කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද **II** කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

1. (අ) සිංහලයට නගන්න.

ජම්බුදීපෙ චන්දභාගා නාම ගංගාතීරෙ හොමගාම නාම අත්ථි. තස්මිං එකො මරුත්තො නාම බ්‍රාහ්මණො පටිවසති. තදා සො වොහාරත්ථාය තක්කසිලං ගන්ත්වා ගෙහං ආගච්ඡන්තො අන්තරාමග්ගෙ එකාය සාලාය කුට්ඨරොගාතුරං සුනඛං දිස්වා තස්මිං කාරුඤ්ඤෙන නීලවල්ලිං තක්කම්බිලෙන මද්දිත්වා පායෙසි. සුනඛො වූපසන්තරොගො පාකතිකො හුත්වා බ්‍රාහ්මණෙන අත්තනො කතූපකාරං සල්ලක්ඛෙන්තො තෙනෙව සද්ධිං අගමාසි. අපරභාගෙ බ්‍රාහ්මණස්ස භරියා ගබ්භං පටිලභි.

(ලකුණු 06 යි)

(ආ) සිංහලයට නගන්න.

සීහො සීසං ගුහං ගන්ත්වා - තෙ අදිස්වා තයො ජනෙ,
අට්ටිතො පුත්තසොකෙන - න ච ඛාදි න චාපිවි.

දාරකෙ තෙ ගවෙසන්තො - අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො'ව - යං යං ගාමමුපෙති සො.

පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං,
සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය.

(ලකුණු 06 යි)

02. (අ) පාලියට නගන්න.

(i) සාමණේර තෙමේ පොත පාඩම් කරයි.
(ii) උපාසකයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියේ ය.
(iii) නුවණැත්තා වහා ධර්මය දැන ගනියි.

(ලකුණු 06 යි)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සීහො හුත්වා හිමවන්තප්පදෙසෙ පබ්බතගුහායං වාසං කප්පෙසි. තස්ස අවිදූරෙ එකං සරං නිස්සාය බහූ සූකරා නිවාසං කප්පෙසුං. තමෙවසරං නිස්සාය තාපසාපි පණ්ණසාලාසු වාසං කප්පෙසුං.අථෙකදිවසං සීහො මහිසවාරණාදීසු අඤ්ඤතරං වධිත්වා යාවදත්ථං මංසං ඛාදිත්වා තං සරං ඔතරිත්වා පානීයං පිවිත්වා උත්තරි. තස්මිං ඛණෙ එකො ථූලසූකරො තං සරං නිස්සාය ගොචරං ගණ්හාති.

(i) පර්වත ගුහාවක වාසය කළේ කවරෙක් ද? (ලකුණු 01 යි)
(ii) පර්වත ගුහාවට නුදුරෙහි තිබුණේ කුමක් ද? (ලකුණු 01 යි)
(iii) වධිත්වා, යාවදත්ථං යන වචන දෙකෙහි අර්ථය ලියන්න. (ලකුණු 02 යි)
(iV) නිග්ගහීත සන්ධි පදයක් ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 02 යි)

## II කොටස

03. (අ) ඔට්ඨජ අකුරු දක්වෙන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් අක්ෂර ප්‍රභේදවලට අයත් අකුරු ලියන්න.

(i) දීර්ඝ ස්වර
(ii) අඝෝෂාක්ෂර
(iii) පවර්ග අකුරු
(iv) තාලුජ අකුරු

(ලකුණු 04 යි)

(ඉ) පහත සඳහන් බාලාවතාර සූත්‍ර පාඨ කෙටියෙන් හඳුන්වන්න.

(i) තත්ථොදන්තා සරා අට්ඨ
(ii) අං ඉති නිග්ගහීතං
(iii) වග්ගානං පඨමදුතියා සොවාසොසා

(ලකුණු 06 යි)

04. (අ) නාමපද පිළිබඳ ප්‍රභේද හතරකි. ඒ මොනවා ද?

(ලකුණු 02 යි)

(ආ) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) යමක අයිතිය ප්‍රකාශ කරන විභක්තිය කුමක් ද? (ලකුණු 01 යි)
(ii) පඨමා විභක්තිය සඳහා යෙදෙන ප්‍රත්‍ය දෙක ලියන්න. (ලකුණු 01 යි)
(iii) "ඒ පුරුෂයෝ " මෙම වාක්‍ය ඛණ්ඩය පාලියෙන් ලියන්න. (ලකුණු 01 යි)
(iv) "ගුණවා" මෙහි ශබ්ද ප්‍රකෘතිය ලියන්න. (ලකුණු 01 යි)

(ඉ) පහත නාමපදවල විභක්තිය හා වචනය ලියන්න.

(i) බුද්ධස්මා
(ii) ගුණවන්තො
(iii) ධනවතං
(iv) චිත්තං
(v) තස්මිං
(vi) කෙසං (ලකුණු 06 යි)

05. (අ) අතීත කාලය හඟවන ආඛ්‍යාත විභක්ති දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පහත ක්‍රියාපදවල ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.

(i) පචාම
(ii) අභවිංසු
(iii) ආහරිස්සති
(iv) දදෙය්‍ය

(ලකුණු 04 යි)

(ඉ) පහත දක්වෙන නිපාත පදවල අර්ථය ලියන්න.

(i) හීයො
(ii) අද්ධා
(iii) අලං
(iv) විනා
(v) සද්ධිං
(vi) සුවෙ

(ලකුණු 06 යි)

06. (අ) පහත සංඛ්‍යා පාලියෙන් ලියන්න.

32

100

(ලකුණු 02 යි)

(ආ) පහත වාක්‍යය කර්මකාරකයට හරවන්න.

(i) බුද්ධො ධම්මං දෙසෙති.

(ii) සීහො මිගෙ මාරෙති.

(iii) අහං ඔදනං පචාමි.

(iv) කුමාරො අම්හෙ පහරන්ති.

(ලකුණු 04 යි)

(ඉ) පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍යය හයකට නොඅඩු රචනාවක් ලියන්න.

(i) සීහො

(ii) මම පරිවෙණං

(iii) ගජො

(iv) සීහලදීපං

(ලකුණු 06 යි)

07. (අ) පහත සන්ධි පද විසන්ධි කරන්න.

නොපෙති

පච්චන්තං

(ලකුණු 02 යි)

(ආ) පහත පදවල සමාස නාමය ලියන්න.

(i) මුඛචන්දො

(ii) චතුද්දිසං

(iii) චන්දසුරියා

(iv) උපනගරං

(ලකුණු 04 යි)

(ඉ) පහත දැක්වෙන තද්ධිත පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන් කරන්න.

(i) ගොතමො

(ii) මානව

(iii) සාකටික

(iv) පාපතම

(v) ගුණවන්තු

(vi) කොසල්ල

(ලකුණු 06 යි)

08. (අ) සිංහල ජාතියේ ඉතිහාසය දැක්වෙන ග්‍රන්ථය කුමක් ද?

(ලකුණු 02 යි)

(ආ) මහාකාව්‍ය ලක්ෂණ හතරක් ලියන්න.

(ලකුණු 04 යි)

(ඉ) "කළගුණ දත් සිංහයා" කථාව කෙටියෙන් දක්වා ඉන් ලබාදෙන ආදර්ශය පෙන්වා දෙන්න.

(ලකුණු 06 යි)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை

State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**

**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**

Year End Term Test – 2021 (2022)

පැය එකයි

**පාලි - I** **4 වසර**

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායන් ගණන,
(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

02. පාලි භාෂාවේ අක්ෂර 43 ක් වශයෙන් දක්වෙන්නේ කිනම් ව්‍යාකරණ සම්ප්‍රදාය තුළ ද?
(1) කච්චායන සම්ප්‍රදාය (2) මොග්ගල්ලායන සම්ප්‍රදාය
(3) සද්දනීති සම්ප්‍රදාය (4) පදසාධන සම්ප්‍රදාය

03. පාලි අක්ෂරමාලාවේ අඝෝෂාක්ෂර ගණන වන්නේ,
(1) 10 කි. (2) 11 කි. (3) 12 කි. (4) 21 කි.

04. "ඊසම්ඵුට්ඨ" අක්ෂර පමණක් ඇතුළත් නිවැරදි වරණය,
(1) ය, ර, ල, ස (2) ය, ර, ල, ව (3) ය, ර, ළ, ව (4) ය, ර, ස, ව

05. ආමන්ත්‍රණවාචී පද යෙදෙන විභක්තිය වන්නේ,
(1) පඨමා විභක්තිය යි. (2) තතියා විභක්තිය යි.
(3) ආලපන විභක්තිය යි. (4) පඤ්චමී විභක්තිය යි.

06. මේ අතරින් ස්ත්‍රී ලිඞ්ගික නාමයක් වන්නේ,
(1) අත්ත (2) අම්බු (3) පුඤ්ඤ (4) කුසුම

07. පඤ්චමී විභක්තිය සඳහා යෙදෙන ප්‍රත්‍ය යුගලය වන්නේ,
(1) ස්මා - හි (2) නා - හි (3) ස - නං (4) ස්මිං - සු

08. "ආචාරියො <u>රථෙන</u> ගෙහං ගච්ඡති" මෙම වාක්‍යයෙහි ඉරි ඇඳි පදය අයත් වනුයේ,
(1) දුතියා විභක්තියට ය. (2) කරණ විභක්තියට ය.
(3) චතුත්ථී විභක්තියට ය. (4) ඡට්ඨී විභක්තියට ය.

09. පාලියෙහි ඇති "නාම විභක්ති ප්‍රත්‍ය" ගණන වන්නේ,
(1) 12 කි. (2) 14 කි. (iii) 16 කි. (iv) 18 කි.

10. "<u>භුඤ්ජතු</u> භවං ගොතමො" මෙහි ඉරි ඇඳි පදය අයත් ආඛ්‍යාත විභක්තිය වන්නේ,
(1) පඤ්චමී ආඛ්‍යාතය යි. (2) අජ්ජතනී ආඛ්‍යාතය යි.
(3) සත්තමී ආඛ්‍යාතය යි. (4) වත්තමානා ආඛ්‍යාතය යි.

11. "අණ කිරීම හා ආශිර්වාදය" යන අර්ථ ඇති ආඛ්‍යාත විභක්තිය වන්නේ,
   (1) සත්තමී ආඛ්‍යාත විභක්තිය යි.   (2) භවිස්සන්තී ආඛ්‍යාත විභක්තිය යි.
   (3) අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය යි.   (4) පඤ්චමී ආඛ්‍යාත විභක්තිය යි.

12. ආඛ්‍යාත සම්බන්ධයෙන් සාවද්‍ය වරණය වනුයේ,
   (1) කාලත්‍රයකි.   (2) පුරුෂත්‍රයකි.   (3) කාරකත්‍රයකි.   (4) වචනත්‍රයකි.

13. "කුජවාරෝ" යනු
   (1) ඉරිදා ය.   (2) බදාදා ය.   (3) අඟහරුවාදා ය.   (4) සිකුරාදා ය.

14. "අහං ඔදනං පචාමි" මෙම වාක්‍ය කර්මකාරකයට හැර වූ පසු
   (1) අහං ඔදනං පචතෙ   (2) මයං ඔදනො පචතෙ
   (3) මයා ඔදනො පචෙ   (4) මයා ඔදනං පච්චතෙ

15. "රාහුල කුමාරො පබ්බජිතෙ" මෙම වාක්‍ය ඛණ්ඩයෙහි නිවැරදි අර්ථය ඇති වරණය තෝරන්න.
   (1) රාහුල කුමාරයා පැවිදි වූ විට   (2) රාහුල කුමාරයා පැවිදි වූ කල්හි
   (3) රාහුල කුමාරයා පැවිදි වූ කල   (4) රාහුල කුමාරයා පැවිදි විය

16. සන්තිකෙ, සන්තිකං, සමීපං, සමීපෙ, අවිදූරෙ යන නිපාත පද යොදනු ලබන්නේ,
   (1) චතුත්ථී විභක්තිය සමඟය   (2) තතියා විභක්තිය සමඟය
   (3) ඡට්ඨී විභක්තිය සමඟය   (4) සත්තමී විභක්තිය සමඟය

17. "උච්චාරභූමිං" යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,
   (1) කසළ දමන තැනට   (2) රොඩු දමන තැනට
   (3) අපද්‍රව්‍ය දමන තැනට   (4) මළපහ දමන තැනට

18. ත්‍යජ්ජ මෙහි නිවැරදි විසන්ධිය වන්නේ,
   (1) තෙ + අජ්ජ   (2) ති + අජ්ජ   (3) ත්‍ය + අජ්ජ   (4) තෙන + අජ්ජ

19. එකාරයට යකාරදේශය සිදුවන බාලාවතාර සූත්‍ර පාඨය තෝරන්න.
   (1) ඉවණ්ණොයන්නවා   (2) යමෙදන්තස්සාදෙසො
   (3) වමොදුදන්තානං   (4) එවාදිස්සරිපුබ්බොච රස්සො

20. "හාත්පස" යන අර්ථය ඇති නිපාත පදය තෝරන්න.
   (1) සමං   (2) සාධුකං   (3) සාමන්තා   (4) විසුං

21. "පච්චන්තං" මෙම පදයෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.
   (1) පච් + අන්තං   (2) පටි + අන්තං   (3) පච්ච + අන්තං   (4) පති + අන්තං

22. කම්මධාරය සමාස පදයකට උදාහරණයකි.
   (1) සද්ධාධනං   (2) ගාමගතො   (3) ධම්මරතො   (4) චන්දසූරිය

23. "සූකරින" යන පදය
   (1) සන්ධි පදයකි.   (2) සමාස පදයකි.   (3) අව්‍ය පදයකි.   (4) තද්ධිත පදයකි.

24. චුල්ලපන්ථකො **සහස්සක්ඛත්තුං** අත්තානං ...... මෙහි ඉරි ඇඳි පදය.
   (1) සංඛ්‍යා තද්ධිත පදයකි.   (2) අනෙකත්ථ තද්ධිත පදයකි.
   (3) භාව තද්ධිත පදයකි.   (4) අව්‍ය තද්ධිත පදයකි.

25. "අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං....... අහොසි" මෙම වාක්‍යයෙහි හිස්තැනට ගැළපෙන වචන දෙක තෝරන්න.
   (1) බ්‍රහ්මදත්තො රාජා   (2) බ්‍රහ්මදත්තො රාජො
   (3) බ්‍රහ්මදත්තං රඤ්ඤං   (4) බ්‍රහ්මදත්තං රාජා

26. “ඡ පඤ්ඤාස” මෙයින් කියැවෙන සංඛ්‍යාව වන්නේ,
(1) 45 (2) 52 (3) 54 (4) 56

27. “රල්ලකො සූචියො” යන පදයෙහි නිවැරදි අර්ථය වන්නේ,
(1) මොණර පිහාටු ය. (2) කුරුළු පිහාටු ය.
(3) සර්ප හැව ය. (4) ඉත්තෑ කුරු ය.

28. “ගුළ මණ්ඩලෙ” යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,
(1) ගුරු මණ්ඩලයෙහි (2) ගුලි සාදන ස්ථානයෙහි
(3) කුහුඹු ගුලෙහි (4) ක්‍රීඩා පිටියෙහි

29. පාලිවංසකථාවන්හි ආරම්භක කෘතිය වන්නේ,
(1) අනාගතවංසය යි. (2) මහාවංසය යි. (3) දීපවංසය යි. (4) බුද්ධ වංසය යි.

30. පාලි ථූපවංසයෙහි කතුවරයා වන්නේ,
(1) දාඨා නාග තෙර (2) උපතිස්ස තෙර
(3) වාචිස්සර තෙර (4) මහානාම තෙර

31. මහාවංසයෙහි 06 වන පරිච්ඡේදයේ ඇතුළත් ගාථා ගණන,
(1) 27 කි. (2) 37 කි. (3) 47 කි. (4) 57 කි.

32. ඩීළී වෙහාසගමනෙ ......... මෙම ගාථාවෙහි අවසාන නාදය වන්නේ,
(1) අථො යා පාපුණෙසියා යන්න යි. (2) හන හිංසා ගතීසුපි යන්න යි.
(3) භුජ පාලන භොජනෙ යන්න යි. (4) බන්ධනෙ මකි මණ්ඩනෙ යන්න යි.

33. “සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි” මෙම වාක්‍යයෙහි “මරුකන්තාරං” යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,
(1) වැලිගොඩට (2) වැලි කාන්තාරයට (3) වැලිතලාවට (4) වැලි මිදුලට

34. අතීත රූපනී ආසී - අතීව කාම ගිද්ධිනී
දෙවෙන දෙවියා චාපි - ..................... යන ගාථාවේ හිස්තැන පිරවීමට යෙදිය යුතු පද පේළිය සොයන්න.
(1) ලජ්ජාසි ජිගුච්ජිතා (2) මහෙසී තස්ස රාජිනො
(3) රාජධීතා ජනෙසි සා (4) ධීතරං සීහසීවලිං

35. මහානාම හිමියන් විසින් රචිත මහාවංසයෙහි පළමු පරිච්ජේදය වන්නේ,
(1) විජයාගමනං (2) මහාසම්මත වංසං
(3) පඨමධම්මසංගීති (4) මහියංගනාගමනං

36. “වංස” යන්නෙහි අර්ථය වන්නේ,
(1) අඹගස යන්න යි. (2) පොල්ගස යන්න යි.
(3) උණගස යන්න යි. (4) බෝ ගස යන්න යි.

37. “ජංඝාමග්ගෙන” යනු,
(1) ප්‍රධාන මාර්ගය වීම. (2) අඩිපාරක් වීම.
(3) ගම්සභා පාරක් වීම. (4) බොරළු පාරක් වීම.

38. “වමොදුදන්තානං” යන සූත්‍රයෙන් සිදු වී ඇති සන්ධිපදය මින් කුමක් ද?
(1) ස්වාගතං (2) යථරිව (3) මාතුපට්ඨානං (4) පච්චන්තං

39. මට්ටකුණ්ඩලීට පාණ්ඩු රෝගය සැදෙන විට වයස කොපමණ වන්නේ ද?
(1) අවුරුදු 11 කි. (2) අවුරුදු 12 කි. (3) අවුරුදු 15 කි. (4) අවුරුදු 16 කි.

40. එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ, එය්‍යාමි, එය්‍යාම යන ප්‍රත්‍යන්ගෙන් ආරම්භවන ආඛ්‍යාත පද අයත් ආඛ්‍යාත විභක්ති වන්නේ,
(1) පඤ්චමී (2) සත්තමී (3) අජ්ජතනී (4) කාලාතිපත්ති

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)
ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

**පාලි - II** **4 වසර**

❖ I කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, II කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) සිංහලට නගන්න.

අතීතෙ එකො වෙජ්ජො ගාමනිගමෙසු චරිත්‍වා වෙජ්ජකම්මං කරොන්තො එකං චක්ඛුදුබ්බලං ඉත්‍ථිං දිස්වා පුච්ඡි. කිං තෙ අඵාසුකන්ති. අක්ඛීහි න පස්සාමීති. භෙසජ්ජං තෙ කරොමීති. කරොහි සාමීති. කිම්මෙ දස්සසීති. සචෙ මෙ අක්ඛීනි පාකතිකානි කාතුං සක්ඛිස්සසි අහං තෙ පුත්තධීතාහි සද්ධිං දාසි භවිස්සාමීති. සො භෙසජ්ජං සංවිදහි. එකභෙසජ්ජේනෙව අක්ඛීනි පාකතිකානි අහෙසුං. සා චින්තෙසි, අහං එතස්ස පුත්තධීතාහි සද්ධිං දාසී භවිස්සාමීති පටිජානිං.

(ලකුණු 06)

(ආ) සිංහලට නගන්න.

තස්සා එස්සෙනා' තිරත්තො - පිට්ඨිං ආරොපියාසු තං,
සීහො සකං ගුහං නෙත්‍වා - තාය සංවාස'මාචරි.

තෙන සංවාසමන්‍වාය - කාලෙන යමෙක දුවෙ,
පුත්තං ච ධීතරංචා'ති - රාජධීතා ජනෙසි සා.

පුත්තස්ස හත්‍ථපාදාසුං - සීහා'කාරා තතො අකා,
නාමෙන සීහබාහුං තං - ධීතරං සීහසීවලිං.

(ලකුණු 06)

02. (අ) පාලියට නගන්න.

(i) ඒ දාසිය විසින් දෙන්නු බඳිනු ලැබේ.
(ii) ශ්‍රද්ධාවන්ත උපාසකයන් විසින් භික්ෂූන්ට දානය දෙන ලද්දේ වෙති.
(iii) සිද්ධාර්ථ කුමාරයා ඇසළ පුන්පෝදා රාත්‍රියෙහි ගිහිගෙයින් නික්මුණේ ය.

(ලකුණු 06)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ අපරභාගෙ එකො අස්සවාණිජකො අස්සවාණිජ්ජාය පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගම්ම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි. අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ. සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහීති ආහ. වාණිජො අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි. සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං චින්තෙසි.

(i) නිවැසි කාන්තාවන්ට වෙළෙන්දාගෙන් ලැබුණු දේ මොනවා ද?
(ii) පසු කලක කාන්තාවගේ නිවසේ නතර වුයේ කවු ද?
(iii) ධීතුසිනෙහං, පතිට්ඨාපෙත්වා යන වචන දෙකෙහි අර්ථය ලියන්න.
(iv) ඉහත ඡේදයේ ඇති "පූර්වක්‍රියා" පද 04 ක් තෝරා ලියන්න.

(ලකුණු 01 + 01 + 02 + 02 = 06)

## II කොටස

03. (අ) දන්තජ අකුරු දැක්වෙන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න. (ලකුණු 02)

(ආ) පහත සඳහන් අක්ෂර ප්‍රභේදයන්ට අයත් අකුරු ලියන්න.
(i) අන්තඃස්ථාක්ෂර
(ii) ඝෝෂාක්ෂර
(iii) මහප්‍රාණාක්ෂර
(iv) ට වග්ගරළා මුද්ධජා

(ලකුණු 04)

(ඇ) පහත සඳහන් බාලාවතාර සූත්‍ර පාඨයන්හි අර්ථය ලියන්න.
(i) වග්ගානං පඨමදුතියා සොචාඝොසා
(ii) සෙසා බ්‍යඤ්ජනා
(iii) ලහුමත්තා තයො රස්සා

(ලකුණු 06)

04. (අ) නාම පදයක් විභක්ති කීයක වරනැගේ ද? එයින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
(i) පුල්ලිංග උකාරන්ත "ගුණවන්තු" ශබ්දයෙහි "දුතියා" විභක්ති ඒක වචන හා බහු වචනය ලියන්න.
(ii) සත්තමී විභක්තිය සඳහා යෙදෙන ප්‍රත්‍ය දෙක ලියන්න.
(iii) "ඉමෙසං රූපානං" මෙම වාක්‍ය ඛණ්ඩය සිංහලයට නගන්න.
(iv) ආලපන විභක්තියෙන් සිදුවන කාර්ය කුමක් ද?

(ලකුණු 04)

(ඇ) පහත නාම පදවල විභක්තිය හා වචනය ලියන්න.
(i) විමානෙ (ii) අඤ්ඤෙන (iii) ගච්ඡන්තානං
(iv) භගවති (v) චිත්තෙන (vi) අහං (ලකුණු 06)

05. (අ) ආඛ්‍යාත විභක්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) පහත ක්‍රියාපදවල ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.
(i) ගච්ඡතු (ii) ලිඛාම (iii) අපචා (iv) ධාවිංසු (ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන නිපාත පදවල අර්ථය ලියන්න.
(i) ධුවං (ii) තිරියං (iii) යාව
(iv) නනු (v) දිවා (vi) ඛිප්පං (ලකුණු 06)

06. (අ) පහත සංඛ්‍යා පාලියෙන් ලියන්න.
(i) 10 (ii) 21 (ලකුණු 02)

(ආ) පහත වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(i) මුනිනා ධම්මො දෙසිතො.
(ii) අම්මෙහි චන්දො පස්සීයති.
(iii) චොරෙන ගොණො චොරීයති.
(iv) දාසෙහි මිත්තානං සුනඛො හරීයතෙ.
(ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නො අඩු රචනාවක් ලියන්න.
(i) මම පරිවෙණං
(ii) ගජො
(iii) සීහලදීපං
(iv) සාරිපුත්තාථෙරො
(ලකුණු 06)

07. (අ) පහත සන්ධිපද විසන්ධි කරන්න.
(i) උපෙක්ඛති (ii) යථරිව (ලකුණු 02)

(ආ) පහත පද අයත් සමාසය ලියන්න.
(i) නීලං ච තං උප්පලං (ii) චන්දො ච සූරියොච
(iii) තයො ලෝකො (iv) ධම්මං නිස්සිතො (ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන තද්ධිත පදවල ප්‍රත්‍ය වෙන් කරන්න.
(i) සාතික (ii) කදා (iii) සාකටික
(iv) භාතුබ්බ (v) රජ්ජ (vi) දක්ඛී (ලකුණු 06)

08. (අ) අදින්න පුබ්බක බමුණා පුතාට පළඳනාවක් සකස් කළේ කෙසේ ද? (ලකුණු 02)

(ආ) මහාවංශය පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 04)

(ඉ) "අකාරුණිකො වෙදාණෝ" යන කථාව කෙටියෙන් ලියා සමාජයට ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

පැය එකයි

**පාලි - I** **4 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

➢ **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**

01. කච්චායන සම්ප්‍රදයට අයත්වන ව්‍යාකරණ ග්‍රන්ථයක් වනුයේ.
(1) පද සාධනය (2) පයෝග සිද්ධිය (3) බාලාවතාරය (4) මොග්ගල්ලායනය

02. මොග්ගල්ලායන සම්ප්‍රදායට අනුව පාලි වර්ණ මාලාවේ ස්වර අක්ෂර ගණන.
(1) 08 යි. (2) 09 යි. (3) 10 යි. (4) 11 යි.

03. ''**වග්ගානං පඨම දුතියා සො චා සොසා**'' යන බාලාවතාර සූත්‍රයේ අර්ථය වනුයේ.
(1) වර්ගයන්ගේ පළමු හා දෙවන අකුරු ඝෝෂ වේ.
(2) වර්ගයන්ගේ පළමු හා දෙවන අකුරු අඝෝෂ වේ.
(3) වර්ගයන්ගේ පළමු හා දෙවන අකුරුත් ස කාරයත් ඝෝෂ වේ.
(4) වර්ගයන්ගේ පළමු හා දෙවන අකුරුත් ස කාරයත් අඝෝෂ වේ.

04. ''කණ්ඨොට්ඨජ'' අක්ෂරය වන්නේ,
(1) ව අක්ෂරය යි. (2) ඔ අක්ෂරය යි. (3) එ අක්ෂරය යි. (4) ක අක්ෂරය යි.

05. අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වර්ණය වන්නේ,

(1) සුගන්ධො , ඉච්ඡිතං , සම්ජ්ඣතු , භවභොග , සුබත්ථාය

(2) සුගන්ධො , ඉච්ඡිතං , සම්ජ්ඣතු , හවබොග , සුබත්ථාය

(3) සුගන්ධො , ඉච්චිතං , සම්ජ්ඣතු, භවභොග , සුබත්ථාය

(4) සුගන්දෙ , ඉච්චිතං , සම්ජ්ඣතු , භවභොග , සුබත්ථාය

06. අකාරාදි පිළිවෙළ නිවැරදිව ගලපා ඇති වර්ණය වන්නේ,

(1) ආචරියො , ආකාසො , කස්සපො , කස්සකො

(2) ආචරියො , ආකාසො , කස්සකො , කස්සපො

(3) ආකාසො , ආචරියො , කස්සකො , කස්සපො

(4) ආකාසො , කස්සකො , ආචරියො , කස්සපො

07. පුල්ලිඞ්ග ශබ්ද පමණක් ඇති වර්ණය වනුයේ,

(1) අග්ගි , බුද්ධ , ජම්බු , අත්ත , දෙව

(2) අග්ගි , බුද්ධ , භික්ඛු , අත්ත , දෙව

(3) අග්ගි , බුද්ධ , භික්ඛු , ධනු , දෙව

(4) අග්ගි , නදී , භික්ඛු , බුද්ධ , දෙව

08. ධාතුවකට ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයක් එක් කළ විට සෑදෙන පද හඳුන්වන්නේ

(1) ක්‍රියා පද ලෙස යි.

(2) සමාස පද ලෙස යි.

(3) නිපාත පද ලෙස යි.

(4) නාම පද ලෙස යි.

09. තතියා නාම විභක්තියට අයත් ප්‍රත්‍යය යුගලය,

(1) නා , හි

(2) ස, නං

(3) අං , යො

(4) ස්මා , හි

10. ''**<u>උපාසකෙන</u>** පදීපො ජාලීයතෙ'' යන මෙම වාක්‍යයෙහි අංකිත පදයේ විභක්තිය වනුයේ

(1) පඨමා විභක්තිය යි.

(2) කරණ විභක්තිය යි.

(3) තතියා විභක්තිය යි.

(4) ජට්ඨී විභක්තිය යි.

11. දුතියා විභක්තියෙන් යෙදෙන අර්ථයක් වන්නේ,

(1) වාක්‍යයක කර්ම පදය දුතියාවෙන් යෙදේ.

(2) වාක්‍යයක උක්ත කර්මය දුතියාවෙන් යෙදේ.

(3) කරණාර්ථය දුතියාවෙන් යෙදේ.

(4) වාක්‍යයක උක්ත පදය දුතියාවෙන් යෙදේ.

12. '' **රාජා සබ්බං ධනං දත්වා මඤ්චෙ නිසිදි**'' මෙම වාක්‍යයේ යෙදී ඇති නාම ප්‍රභේද වන්නේ,

(1) ගුණ නාම , නාම නාම , ද්‍රව්‍ය නාම

(2) නාම නාම , සඞ්ඛ්‍යා නාම , සබ්බ නාම

(3) සඞ්ඛ්‍යා නාම , ද්‍රව්‍ය නාම , ගුණ නාම

(4) නාම නාම , සබ්බ නාම , ද්‍රව්‍ය නාම

13. ''**......ඉත්ථී .....එලං අත්තනො පුත්තස්ස අදාසි**'' මෙම වාක්‍යයේ හිස්තැන්වලට සුදුසු සර්වනාම පද යුගලය වනුයේ,

(1) තායො , තානි (2) තා , අයං (3) සා , තං (4) අයං , එතං

14. ''ඊයේ පටන් ප්‍රත්‍යක්ෂ අතීත කාලය'' ප්‍රකාශ කිරීම සඳහා යෙදෙන ආඛ්‍යාත විභක්තිය වන්නේ,

(1) අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය යි. (2) පරොක්ඛා ආඛ්‍යාත විභක්තිය යි.

(3) සත්තමී ආඛ්‍යාත විභක්තිය යි. (4) හීයත්තනී ආඛ්‍යාත විභක්තිය යි.

15. √පච ධාතුවේ අතීත කාල, පරස්සපද, පඨම පුරිස බහු වචන රූපයක් වන්නේ,

(1) අපචිත්ථ (2) අපචිංසු (3) අපචී (4) අපචිං

16. **ආශිර්වාදාර්ථය** ප්‍රකාශ කිරීම සඳහා යෙදෙන ආඛ්‍යාත පදය වන්නේ,

(1) නික්ඛමථ (2) රක්ඛන්තු (3) ආනෙය්‍ය (4) ගච්ඡති

17. ''**යථා**'' යන නිපාතයේ නිවැරදි අර්ථය වන්නේ,

(1) යම්සේ (2) යම් පමණ (3) යම් කලෙක (4) යම් විටක

18. ''බ්‍රහස්පතින්දා'' යන දිනය හැඳින්වීම සඳහා යෙදෙන පාලි වචනය වනුයේ,

(1) ගුරුවාරො (2) බුධවාරො (3) කිවිවාරො (4) කුජවාරො

19. උකාරාන්ත පුල්ලිංග ගුණවන්තු ශබ්දයේ චතුත්ථී විභක්ති එක වචන පද වන්නේ,

(1) ගුණවතං , ගුණවන්තානං (2) ගුණවතා , ගුණවන්තෙන

(3) ගුණවතො , ගුණවන්තස්ස (4) ගුණවා , ගුණවන්තො

20. ''**ඡපඤ්ඤාසාධිකපඤ්චසතුත්තරද්විසහස්සං**'' පාලි ක්‍රමයට ලියා ඇති වැකියෙන් කියවෙන සංඛ්‍යාව,

(1) 6556 යි. (2) 5556 යි. (3) 2656 යි. (4) 2556 යි.

21. මෛත්‍රී බුදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වංසකථාව වන්නේ,

(1) මහාවංසය (2) හත්ථවනගල්ල විහාරවංසය

(3) අනාගතවංසය (4) බුද්ධවංසය

22. ''**සාරීරික**'' යන තද්ධිත පදයේ නිවැරදි පද සිද්ධිය වනුයේ,

(1) සරීර + ණික (2) සරීර + ණිික (3) සරීර + ණ (4) සරීර + ඉක

23. ''**ඇත**'' යන අරුත් ඇති ප්‍රත්‍යය එකතු වී සෑදෙන තද්ධිත ප්‍රභේදය,

(1) අත්ථ්‍යත්ථ තද්ධිත නම් වේ. (2) අනෙකත්ථ තද්ධිත නම් වේ.

(3) අපච්චත්ථ තද්ධිත නම් වේ. (4) භාව තද්ධිත නම් වේ.

24. මහාවංසය රචනා කිරීම සඳහා මූලාශ්‍රය නොවූ ග්‍රන්ථයක් වන්නේ,

(1) සීහළට්ඨකතාව යි. (2) උත්තරවිහාරට්ඨකතාව යි.

(3) දීපවංසය යි. (4) ථූපවංසය යි.

25. ''**අබ්භුග්ගතො**'' යන්නෙහි නිවැරදි විසන්ධි පදය වන්නේ,

(1) අභි + උග්ගතො (2) අබ්භ + උග්ගතො

(3) අබ්භ + ගතො (4) අභි + භුග්ගතො

26. සංඛ්‍යා වාචී පදයක් මුලට යෙදී සිදුවන සමාසය හඳුන්වන්නේ,

(1) ද්වන්ද මාසය නමිනි. (2) දිගු සමාසය නමිනි.

(3) තප්පුරිස සමාසය නමිනි. (4) අව්‍යයීභාව සමාසය නමිනි.

27. පසේ බුදුන්ට සෙනහස පෑ සුනඛයෙකු පිළිබඳ සඳහන් වන කතා පුවත වන්නේ,

(1) කතඤ්ඤු සිගාලො. (2) උජුජාතික සුනඛො

(3) කතවේදී සුනඛො (4) බුද්ධුපට්ඨාකො ද්වෙ තිරච්ඡානා

28. ද්වන්ද සමාස පද පමණක් ඇති වර්ණය වන්නේ,

(1) ධම්මරතො , රුක්ඛමූලං , ජිනවචනං , චන්දසූරියො

(2) චතුද්දිසා , සුගන්ධො , අධිසීලං , චොරභයං

(3) නීලුප්පලං , සීලධනං , සීතුණ්හං , ධම්මබුද්ධි

(4) චන්දසුරියා , මාතාපිතරො , මුඛනාසිකං , සමණ බ්‍රාහ්මණා

29. ''**මදසරෙ**'' යන බාලාවතාර සූත්‍රයෙන් සන්ධි කළ නො හැකි විසන්ධි පදය වන්නේ,

(1) එවං + ඉමං (2) සං + භාවනා

(3) එවං + එව (4) එතං + අවොච

30. පදයක ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම සඳහා යෙදෙන බාලාවතාර සූත්‍රය වන්නේ,

(1) නයෙ පරං යුත්තෙ

(2) වා පරො අසරූපා.

(3) පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ.

(4) සරා සරෙ ලොපං

31. ''විඤ්ඤූ **<u>ඛිප්පං</u>** ධම්මං විජානාති.'' යන මෙහි අංකිත පදය,

(1) කර්ම පදය යි.

(2) කර්තෘ පදය යි.

(3) නාම විශේෂණ පදය යි.

(4) ක්‍රියා විශේෂණ පදය යි.

32. **''න මෙ එතාය <u>'දින්නභතියා''</u> අත්ථො''** මෙහි ඉරි ඇඳි පදයේ අර්ථය වන්නේ,

(1) දුන් බලයෙන්

(2) දුන් බතින්

(3) දුන් බැතියෙන්

(4) දුන් වැටුපෙන්

33. '' ඉක්බො තු දස්සනඹකෙසු

..................................................

චක්බ දස්සෙ චික්බ වාචෙ

දික්බො'පනයමුද්ධිසු''

යන ගාථාවේ දෙවන පදය වන්නේ,

(1) බෙපණෙ ලිඛ ලෙඛනෙ

(2) මොචනෙ රිච රෙචනෙ

(3) ඛී ඛයෙ කඞඛ කඞඛනෙ

(4) ඛි ඛයම්හි ගි සද්දනෙ

34. නිවැරදි පද බෙදීම් සහිත වාක්‍ය වන්නේ,

(1) ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා

(2) ද්වෙ මෙභික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා

(3) ද්වෙ මෙභික්ඛවෙ අන්තාපබ්බජිතෙන න සෙවිතබ්බා

(4) ද්වෙ මෙ භික්ඛවෙ අන්තාපබ්බජිතෙන නසෙවිතබ්බා

35. ''සො ඔදනං පචති'' යන වාක්‍යය අනාගත කාලයෙන් දැක්වෙන්නේ,

(1) ''සො ඔදනං අපචිස්සා'' යනුවෙනි.

(2) ''සො ඔදනං පචි'' යනුවෙනි.

(3) ''තෙ ඔදනං පචන්ති'' යනුවෙනි.

(4) ''සො ඔදනං පචිස්සති'' යනුවෙනි.

36. **''ගුණවන්තු''** ශබ්දයට සමානව වර **නොනැගෙන** ශබ්දයක් වන්නේ,

(1) සීලවා (2) සතිමා (3) ජන්තු (4) බලවා

37. **''ඌන''**යන පදයෙහි විරුද්ධාර්ථ පදය වන්නේ,

(1) අධික (2) ථූල (3) උජු (4) නීච

38. සමාස පදවල ප්‍රධාන ලක්ෂණයක් **නො වන්නේ,**

(1) එක් පදයක් බවට පත්වීම

(2) එක්ව උච්චාරණය වීම

(3) එක් විභක්තියක් වීම

(4) පද දීර්ඝ වීම

39. ද්විකර්මක ධාතුවක් නො වන්නේ,

(1) √දුහ (2) √ගමු (3) √රුධ (4) √පුච්ඡ

40. පාලි භාෂාවේ කිතක ප්‍රභේද ගණන,

(1) 04 කි. (2) 05 කි. (3) 06 කි. (4) 07 කි.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

# වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**පාලි - II** **4 ශ්‍රේණිය**

❖ I කොටසේ ප්‍රශ්න සියල්ලට ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අතීතෙ එකො වෙජ්ජො ගාමනිගමෙසු චරිත්වා වෙජ්ජකම්මං කරොන්තො එකං චක්ඛුදුබ්බලං ඉත්ථිං දිස්වා පුච්ඡි. කිං තෙ අඵාසුකන්ති. අක්ඛීහි න පස්සාමීති. භෙසජ්ජං තෙ කරොමීති. කරොහි සාමීති. කිම්මෙ දස්සසීති. සචෙ මෙ අක්ඛීනි පාකතිකානි කාතුං සක්ඛිස්සසි අහං තෙ පුත්තධීතාහි සද්ධිං දසී භවිස්සාමීති. සො භෙසජ්ජං සංවිදහි. එකභෙසජ්ජෙනෙව අක්ඛීනි පාකතිකානි අහෙසුං. සා චින්තෙසි, අහං එතස්ස පුත්තධීතාහි සද්ධිං දසී භවිස්සාමීති පටිජානිං. 'වඤ්චෙස්සාමි නන්ති' සා වෙජ්ජෙන කීදිසං භද්දෙති පුට්ඨා, පුබ්බෙ මෙ අක්ඛීනි ථොකං රුජිංසු. ඉදනි අතිරෙකතරං රුජන්තී ති ආහ.

(ලකුණු 06)

(ආ) පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

රඤ්ඤො කුමාරං දස්සෙසුං - තං රාජා ඉද'මබ්‍රවි,
''ගහිතො යදි සීහො තෙ - දම්මි රට්ඨං තදෙව තෙ.''
සො තං ගන්ත්වා ගුහාද්වාරං - සීහං දිස්වා'ව ආරකා,
එන්තං පුත්තසිනෙහෙන - විජ්ඣිතුං තං සරං ඛිපි.
සරො නලාට මාහච්ච - මෙත්තචිත්තෙන තස්ස තු,
කුමාරපාදමූලෙ'ව - නිවත්තො පති භූමියං.

(ලකුණු 2 × 3 = 6)

02. (අ) පාලියට නගන්න.

i. ශ්‍රද්ධාවන්තයෝ සුදු මලින් නිතර බුදුන් පුදති.
ii. මහාමයාදේවිය කළුරියකොට තුසිත පුරයෙහි උපන්නාය.
iii. මම හැමද ම පිරිවෙණට යමි.

(ලකුණු 06)

(ආ) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එකස්මිං කිර සමයෙ ලඞ්කායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූලූපට්ඨාකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගලඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි. රාජා කිර තං හත්ථිනං ගතට්ඨානං උපපරික්ඛාපෙන්තො අදිස්වා චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙන්තො චූලූපට්ඨාකතිස්සාමච්චං පාචීනපස්සං පෙසෙසි. සෙසදිසාසු ගතා හත්ථිං න පස්සිංසු. සො පනෙස අමච්චො ගාමනිගමපරම්පරාය විචරන්තො තමෙව විහාරං සම්පාපුණි. තතො කණ්ඩුලො නාම වාරණරාජා තදා සුපක්කං කාරඵලසහිතං කාරසාඛං භින්දිත්වා භික්ඛූනං පතිගණ්හාපෙසි. අමච්චො රඤ්ඤො සන්තිකං ගන්ත්වා දෙව, නිජ්ඣරවිහාරෙ භික්ඛූනො වෙය්‍යාවච්චං කරොන්තො හත්ථිනාගො මයා දිට්ඨොති කථෙසි. තං සුත්වා රාජා ත්වමෙව භණෙ හත්ථිං ගහෙත්වා ආගච්ඡාහීති නියොජෙසි.

i. එකළ ලංකාවේ රජකම්කල රජතුමාගේ නම කුමක් ද?

ii. රජතුමාගේ ඇතාගේ නම කුමක් ද?

iii. **'දෙව, නිජ්ඣරවිහාරෙ භික්ඛූනො වෙය්‍යාවච්චං කරොන්තො හත්ථිනාගො මයා දිට්ඨොති කථෙසි'** යන්නෙහි අර්ථය ලියන්න.

iv. ඇතා භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කළේ කෙසේ ද?

(ලකුණු 1 + 1 + 2 + 2 = 6)

## II කොටස

03. (අ) ''රූපසිද්ධිය''නැමති ව්‍යාකරණ ග්‍රන්ථය අයත් වන ව්‍යාකරණ සම්ප්‍රදායේ නම කුමක් ද?

(ලකුණු 02)

(ආ) පහත සඳහන් බාලාවතාර සූත්‍රවල අර්ථ ලියන්න.

i. අඤ්ඤෙ දීඝා

ii. ළන්තාඤ්ඤෙ ඝොසා

iii. වග්ගා පඤ්චපඤ්චසො මන්තා

iv. අං ඉති නිග්ගහීතං (ලකුණු 04)

(ඉ) පහත සඳහන් අක්ෂර උප්පත්ති ස්ථාන වලින් උපදින අක්ෂර ලියා දක්වන්න.

i. උගුර ( කණ්ඨ)

ii. තල්ලේ මුදුන (මුද්ධ)

iii. දත් (දන්ත) (ලකුණු 06)

04. (අ) නාම පදයක් සාදගන්නා ආකාරය ලියා දක්වන්න. (ලකුණු 02)

(ආ) පහත සඳහන් වාක්‍යයෙහි ඇති **නාම පදවල** විභක්තිය ලියන්න.

භික්ඛු පීඨෙ නිසීදිත්වා සාවකස්ස ධම්මං දෙසෙති. (ලකුණු 04)

(ඉ) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. දුතියා හා ඡට්ඨී නාම විභක්ති හඳුන්වන බාලාවතාර සූත්‍ර ලියා දක්වන්න.

ii. සර්වනාම පද හතරක් ලියන්න. (ලකුණු 2 + 4 = 6)

05. (අ) අනුමත කිරීම හා පරිකල්පන යන අර්ථ ප්‍රකාශ කරන ආඛ්‍යාත විභක්තිය නම් කරන්න. (ලකුණු 02)

(ආ) පහත සඳහන් සංඛ්‍යා පාලියෙන් ලියන්න.

i. 1210 ii. 2320 (ලකුණු 04)

(ඉ) **''භූ සත්තායං පච පාකෙ ගමු - සප්ප ගතිම්හිච...''** මෙහි ඇති එක් ධාතුවක් වත්තමාන අඛ්‍යාත, පරස්සපදයේ වරනගන්න. (වගු ගත කිරීම අනිවාර්යයි.) (ලකුණු 06)

06. (අ) පහත සඳහන් යුගල පද පාලියෙන් ලියන්න.

i. ආහාරපාන ii. කැයුතු අනුභව කළ යුතු (ලකුණු 02)

(ආ) පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

i. පුරිසො රුක්ඛං ඡින්දති.

ii. සාමණෙරො පොත්ථකං පඨිස්සති.

iii. තුම්හෙ භික්ඛුස්ස පත්තං දෙථ.

iv. දසො රථෙන ගාමං ගච්ඡි. (ලකුණු 04)

(ඉ) පහත දක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නො අඩු රචනාවක් ලියන්න.

i. මම පණ්ණසාලං

ii. සිරිලංකාදීපං

iii. බිළාලො

iv. ජයමහාබොධිං (ලකුණු 06)

07. (අ) පහත සඳහන් පද අයත්වන සමාසය ලියන්න.

i. බ්‍රාහ්මණදාරිකා ii. තිලොකං iii. මාතාපිතරො iv ජිතින්ද්‍රියො (ලකුණු 04)

(ආ) පහත සඳහන් විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

i. ලොක + අගෙගා ii. සද්ධා + ඉධ (ලකුණු 04)

(ඉ) තද්ධිත ප්‍රභේද හතරක නම් ලියන්න. (ලකුණු 04)

08. (අ) මහාවංසයේ පළමුවන (1 - 37 පරිච්ඡේද) කොටස රචනා කළ කතුවරයාගේ නම කුමක් ද?

(ලකුණු 02)

(ආ) බුදුරදුන්ගේ ශාරීරික ධාතු වස්තු විෂය කොට රචිත වංසකථා 02ක් නම් කරන්න.

(ලකුණු 04)

(ඉ) සිංහබාහු කුමාරයාගේ චරිතය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

| 02 | S | I |
|---|---|---|

වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
வருட இறுதிப் பரீட்சை – 2023 (2024)
Year End Test – 2023 (2024)

පැය එකයි

(02) පාලි I — 04 ශ්‍රේණිය

**සැලකිය යුතුයි.**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40 ක්** ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- මෙම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදායට අයත් අක්ෂර ගණන,

(1) 20 කි. (2) 33 කි. (3) 41 කි. (4) 43 කි.

02. පාලි භාෂාවේ ඊෂත්පෘෂ්ට අක්ෂර පමණක් ඇති වරණය තෝරන්න.

(1) අ, ඉ, උ, එ (2) ය, ර, ල, ව (3) ආ, ඊ, ඌ, එ (4) ට, ඨ, ඩ, ඪ

03. '**වග්ගානං පඨමදුතියා සොවාසොසා**' යන බාලාවතාර සූත්‍ර පාඨයෙන් හඳුන්වනු ලබන්නේ,

(1) අඝෝෂ අක්ෂරයන් ය. (2) ඝෝෂ අක්ෂරයන් ය.
(3) හ්‍රස්ව අක්ෂරයන් ය. (4) වර්ගාක්ෂරයන් ය.

04. **ල, ස** යනු,

(1) කණ්ඨජාක්ෂරයන් ය. (2) දන්තජාක්ෂරයන් ය.
(3) ඔට්ඨජාක්ෂරයන් ය. (4) මුද්ධජාක්ෂරයන් ය.

05. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද ඇතුළත් වරණය තෝරන්න.

(1) අනනො, බබ්බුව, සත්තාරො (2) අනනො, බහුව, සත්තාරො
(3) අණනො, බබ්බුව, සත්ථාරො (4) අනණො, බහුව, සත්ථාරො

06. එක, ද්වි, ති, චතු, පංච, අට්ඨ යනු,

(1) සර්ව නාම පද යි. (2) සංඛ්‍යා නාම පද යි.

(3) ද්විලිංග නාම පද යි. (4) අලිංග නාම පද යි.

07. ආඛ්‍යාත පදයන්ගේ ලක්ෂණයක් නොවන්නේ,

(1) කාල තුනකින් යුක්ත වීම ය. (2) පුරිස තුනකින් යුක්ත වීම ය.

(3) කාරක තුනකින් යුක්ත වීම ය. (4) ලිංග භජනය කිරීම ය.

08. මෛත්‍රී බුදුරදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වංසකථාව වන්නේ,

(1) අනාගතවංසය යි. (2) මහාවංසය යි. (3) දීපවංසය යි. (4) බුද්ධවංසය යි.

09. **'ඛෙත්තවත්ථු'** යන වචනය පාලි භාෂාවේ යෙදෙන,

(1) නිපාත පදයකි. (2) උපසර්ග පදයකි. (3) යුගල පදයකි. (4) විරුද්ධ පදයකි.

10. **'මාගසිර'** යනු,

(1) උඳුවප් මාසය යි. (2) දුරුතු මාසය යි. (3) නවම් මාසය යි. (4) බක් මාසය යි.

11. **'සත්තරසාධිකද්විසහස්ස'** යන්නෙන් ප්‍රකාශ වන සංඛ්‍යාව වන්නේ,

(1) 246 වේ. (2) 2018 වේ. (3) 2023 වේ. (4) 2017 වේ.

12. **"භුඤ්ජතු** භවං ගොතමො" මෙහි ඉරි ඇඳි පදය අයත් ආඛ්‍යාත විභක්තිය වන්නේ,

(1) පඤ්චමී ආඛ්‍යාතය යි. (2) අජ්ජතනී ආඛ්‍යාතය යි.

(3) සත්තමී ආඛ්‍යාතය යි. (4) වත්තමානා ආඛ්‍යාතය යි.

13. පාලි ථූපවංසයෙහි කතුවරයා වන්නේ,

(1) දාඨානාග තෙරුන් ය. (2) උපතිස්ස තෙරුන් ය.
(3) වාචිස්සර තෙරුන් ය. (4) මහානාම තෙරුන් ය.

14. සන්තිකෙ, සන්තිකං, සමීපං, සමීපෙ, අවිදූරෙ යන නිපාත පද යොදනු ලබන්නේ,

(1) චතුත්ථී විභක්තිය සමග ය. (2) තතියා විභක්තිය සමග ය.

(3) ඡට්ඨී විභක්තිය සමග ය. (4) සත්තමී විභක්තිය සමග ය.

15. **"උච්චාරභූමිං"** යන්නෙහි නිවැරදි අර්ථය තෝරන්න.

(1) කසළ දමන තැනට ය. (2) රොඩු දමන තැනට ය.

(3) අපද්‍රව්‍ය දමන තැනට ය. (4) මලපහ දමන තැනට ය.

16. **'ත්‍යජ්ජ'** මෙහි නිවැරදි විසන්ධි පදය තෝරන්න.

(1) තෙ + අජ්ජ (2) ති + අජ්ජ (3) ත්‍ය + අජ්ජ (4) තෙන + අජ්ජ

17. **'නයිමස්ස '** යන සන්ධි පදය අයත් සන්ධි ප්‍රභේදය වන්නේ,

(1) පූර්වස්වර ලෝපය. (2) අසවර්ණාදේශය. (3) ද්විත්වය. (4) ආගමය.

18. පාලි භාෂාවේ සමාස ප්‍රභේද ගණන,

(1) 04 කි. (2) 05 කි. (3) 06 කි. (4) 07 කි.

19. කම්මධාරය සමාසයට අයත් නිදසුනක් වන්නේ,

(1) සද්ධාධනං යන්න යි. (2) ගාමගතො යන්න යි.
(3) ධම්මරතො යන්න යි. (4) චන්දසුරියා යන්න යි.

20. සංඛ්‍යාවාචී පදයක් මුලට යෙදී සිදුවන සමාසය,

(1) තප්පුරිස සමාසය යි. (2) දිගු සමාසය යි.

(3) ද්වන්ද සමාසය යි. (4) බහුබ්බීහි සමාසය යි.

21. පාලි භාෂාවේ ප්‍රධාන තද්ධිත කොටස්,

(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

22. පුත්‍රාර්ථය ප්‍රකාශ වන තද්ධිතය වන්නේ,

(1) අපච්චත්ථ තද්ධිත ය. (2) අත්ථ්‍යත්ථ තද්ධිත ය.

(3) අනේකත්ථ තද්ධිත ය. (4) භාව තද්ධිත ය.

23. තර, තම යන ප්‍රත්‍යය දෙක අයත් වන්නේ,

(1) අපච්චත්ථ තද්ධිතයට යි. (2) අත්ථ්‍යත්ථ තද්ධිතයට යි.

(3) අනේකත්ථ තද්ධිතයට යි. (4) භාව තද්ධිතයට යි.

24. පාලි භාෂාවේ කිතක ප්‍රභේද ගණනින් කීය ද?

(1) හතරකි. (2) දෙකකි. (3) හයකි. (4) පහකි.

25. ත්‍රෛකාලික කිතක ප්‍රත්‍යය පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) තබ්බ, රිච්ච, තය්‍ය, අනීය (2) තබ්බ, රිච්ච, මාන, අනීය,

(3) තබ්බ, අන්ත, මාන, අනීය, (4) අන්ත, රිච්ච, මාන, අනීය,

26. පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය වශයෙන් සැලකෙන්නේ,

(1) අනාගතවංසය යි. (2) මහාවංසය යි. (3) දීපවංසය යි. (4) බුද්ධවංසය යි.

27. දාඨාවංසයෙහි ඇතුළත් ගාථා සංඛ්‍යාව වන්නේ,

(1) 415 කි. (2) 416 කි. (3) 423 කි. (4) 548 කි.

28. මහාවංසය සම්පාදනයේ දී ප්‍රධාන මූලාශ්‍රය වූයේ,

(1) දාඨාවංසය යි. (2) සීහළට්ඨකථා මහාවංසය යි.

(3) දීපවංසය යි. (4) හත්ථවනගල්ල විහාරවංසය යි.

29. **'රුධි ආවරණෙ මුච'**...... මෙම ගාථාවෙහි අවසාන පාදය වන්නේ,

(1) 'අථො යා පාපුණෙසියා' යන්න යි. (2) 'හන හිංසා ගතීසුපි' යන්න යි.

(3) 'භුජ පාලනභොජනෙ' යන්න යි. (4) 'බන්ධනෙ මකි මණ්ඩනෙ' යන්න යි.

30. 'අසවර්ණාදේශයට' අදාළ බාලාවතාර සූත්‍ර පාඨය වන්නේ,

(1) 'සරා සරෙ ලොපං' යන්න යි. (2) 'යමෙදන්තස්සාදෙසො' යන්න යි.

(3) 'ඉවණ්ණො යං නවා' යන්න යි. (4) 'ක්වචාසවණ්ණං ලුත්තෙ' යන්න යි.

31. 'චුල්ලපන්ථකො <u>**සහස්සක්ඛත්තුං**</u> අත්තානං ......' මෙහි ඉරි ඇඳි පදය.

(1) සංඛ්‍යා තද්ධිත පදයකි. (2) අනෙකත්ථ තද්ධිත පදයකි.

(3) භාව තද්ධිත පදයකි. (4) අව්‍ය තද්ධිත පදයකි.

32. "අතීතෙ ජම්බුදීපෙ අජිතරට්ඨෙ ............ වසි." මෙහි හිස්තැනට ගැළපෙන පද තෝරන්න.

(1) එකො ගොපාලකං (2) එකො ගොපාලකො

(3) එකා ගොපාලකං (4) එකො ගොපාලකා

33. **"සෙරිවාරසුඛත්ථිනී."** මෙම වචනයෙහි නිවැරදි අර්ථය වන්නේ.

(1) පිරිස සමග හැසිරීමේ සුවය කැමතිය යන්න යි.

(2) ස්වෛරීව හැසිරීමේ සුවය කැමතිය යන්න යි.

(3) දෙදෙනකු සමග හැසිරීමේ සුවය කැමතිය යන්න යි.

(4) තිදෙනකු සමග හැසිරීමේ සුවය කැමතිය යන්න යි.

34. 'සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි' මෙහි **"මරුකන්තාරං"** යන්නෙහි නිවැරදි අර්ථය,

(1) වැලිගොඩට යන්න යි.
(2) වැලි කාන්තාරයට යන්න යි.
(3) වැලිතලාවට යන්න යි.
(4) වැලි මිදුලට යන්න යි.

35. 'අතීව රූපිනී ආසී - අතීව කාමගිද්ධිනී

දෙවෙන දෙවියා චාපි - ............' යන ගාථාවේ හිස්තැනට ගැළපෙන පේළිය වන්නේ,

(1) ලජ්ජායාසි ජිගුච්ජිතා.
(2) මහෙසී තස්ස රාජිනො.
(3) රාජධීතා ජනෙසි සා.
(4) ධීතරං සීහසීවලිං.

36. මහාවංසයෙහි පළමු පරිච්ඡේදය නම්කර ඇත්තේ,

(1) විජයාගමනං යනුවෙනි.
(2) මහාසම්මත වංසං යනුවෙනි.
(3) පඨමධම්මසංගීති යනුවෙනි.
(4) මහියංගනාගමනං යනුවෙනි.

37. **'අහං ඔදනං පචාමි'** මෙම වාක්‍යයේ කර්මකාරක ස්වරූපය වන්නේ,

(1) අහං ඔදනං පචතෙ.
(2) මයං ඔදනො පචතෙ.
(3) මයා ඔදනො පචෙ.
(4) මයා ඔදනො පච්චතෙ.

38. "අණ කිරීම හා ආශිර්වාදය" යන අර්ථ ඇති ආඛ්‍යාත විභක්තිය වන්නේ,

(1) සත්තමී ආඛ්‍යාත විභක්තිය යි.
(2) භවිස්සන්ති ආඛ්‍යාත විභක්තිය යි.
(3) අජ්ජතනී ආඛ්‍යාත විභක්තිය යි.
(4) පඤ්චමී ආඛ්‍යාත විභක්තිය යි.

39. මහාවංසයෙහි 06 වන පරිච්ඡේදයේ ඇතුළත් ගාථා ගණන,

(1) 27 කි.
(2) 37 කි.
(3) 47 කි.
(4) 57 කි.

40. අතීතකාල ක්‍රියා පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නමථ, පචන්තු, අවන්දි, පචො
(2) හසිස්සන්ති, පචො, භාසෙය්‍ය, භජෙ
(3) පහරිත්ථ, අවන්දිං, ධාවො, පතිංසු
(4) ආලයති, ජගාම, අලභිස්සං, වන්දසෙ

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

| 02 | S | II |
|---|---|---|

වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
வருட இறுதிப் பரீட்சை – 2023 (2024)
Year End Test – 2023 (2024)

පැය තුනයි

(02) පාලි II 04 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි.** අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- **සැලකිය යුතුයි.**
  I කොටසේ ප්‍රශ්න **දෙක ද,** II කොටසින් **ප්‍රශ්න තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) **සිංහලට** නගන්න.

ජම්බුදීපෙ චන්දභාගා නාම ගංගාතීරෙ හොමගාමනාම අත්ථි. තස්මිං එකො මරුත්තො නාම බ්‍රාහ්මණො පටිවසති. තදා සො වොහාරත්ථාය තක්කසිලං ගන්ත්වා ගෙහං ආගච්ඡන්තො අන්තරා මග්ගෙ එකාය සාලාය කුට්ඨරොගාතුරං සුනඛං දිස්වා තස්මිං කාරුඤ්ඤෙන නීලවල්ලිං තක්කම්බිලෙන මද්දිත්වා පායෙසි. සුනඛො වූපසන්තරොගො පාකතිකො හුත්වා බ්‍රාහ්මණෙන අත්තනො කතුපකාරං සල්ලක්ඛෙන්තො තෙනෙව සද්ධිං අගමාසි. අපරභාගෙ බ්‍රාහ්මණස්ස භරියා ගබ්භං පටිලභි. පරිපුණ්ණගබ්භාය තාය විජායනකාලෙ දාරකො තිරියම්පතිත්වා අන්තො ගබ්භෙයෙව මතො. තදා තං සත්ථෙන ඛණ්ඩාඛණ්ඩිතං, ඡින්දිත්වා නීහරිංසු. අථ බ්‍රාහ්මණො තං දිස්වා නිබ්බින්නහදයො ඝරාවාසං පහාය ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා අරඤ්ඤෙ විහරති. අථස්ස භරියා අඤ්ඤෙන සද්ධිං සංවසන්තී අයං මං පහාය පබ්බජිතො'ති බ්‍රාහ්මණෙ පදුට්ඨචිත්තා හො, බ්‍රාහ්මණං මාරෙහී'ති සාමිකෙන සද්ධිං මන්තෙසි.

(ලකුණු 06)

(ආ). පහත සඳහන් ගාථා **සිංහලට** නගන්න.

i. තථෙව ද්වෙ සහස්සානි - තීණි චා'පි නරිස්සරො,
ද්වීසු වාරෙසු වාරෙසි - මාතා සීහභුජං හි තං.

ii. අග්ගහි තතියෙ වාරෙ - සීහබාහු අපුච්ඡිය,
මාතරං තිසහස්සං තං - ඝාතෙතුං පිතරං සකං.

iii. රඤ්ඤො කුමාරං දස්සෙසුං - තං රාජා ඉද'මබ්‍රවී,
"ගහිතො යදි සීහො තෙ - දම්මි රට්ඨං තදෙව තෙ."

(ලකුණු 06)

02. (අ) **පාලියට** නගන්න.

i) පිණ්ඩෝල භාරද්වාජ හිමියෝ අහසින් ගොස් පාත්‍රය ගත්හ.

ii) දේවානම්පියතිස්ස රජ මහාමහින්ද තෙරුන්ගෙන් ධර්මය අසා බුද්ධ ශ්‍රාවකයෙක් විය.

iii) බුදුන් වහන්සේ සත්දිනක් අනුපිය අඹ වනයෙහි විසූ සේක.

(ලකුණු 2 × 3 = 06)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ අපරභාගෙ එකො අස්සවාණිජකො අස්සවණිජ්ජාය පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගම්ම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි. අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ. සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහීති ආහ. වාණිජො අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි. සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං චින්තෙසි. "පුඤ්ඤකරණස්ස මෙ සහායො ලද්ධො"ති. අගතපුබ්බා ච මෙ භගවතො සමාරං මාරබලං විධමෙත්වා බුද්ධභූතස්ස ජයමහාබොධිභූමි. යන්නූනාහං තත්ථ ගන්ත්වා භගවතො ජයමහාබොධිං වන්දෙය්‍යන්ති චින්තෙත්වා බහුරජතසුවණ්ණමාලාදයො කාරාපෙත්වා එකදිවසං අස්සමභිරුය්හ ආකාසෙන ගන්ත්වා බොධිමාලකෙ ඨත්වා ආගච්ඡන්තු අය්‍යා සුවණ්ණමාලා පූජෙතුන්ති උග්ඝොසෙසි.

i) නිවැසි කාන්තාවට වෙළෙන්දාගෙන් ලැබුණේ මොනවා ද?

ii) **"ජයමහාබොධිභූමිං"** ලෙස එම ස්ථානය හැඳින්වීමට හේතුව කුමක් ද?

iii) ආර්යයන් වහන්සේලාට බෝධිමළුවට වඩින්න යැයි අයැද සිටියේ කුමක් සඳහා ද?

iv) **"අරියසාවක"** යන්නට අයත් ආර්ය පුද්ගලයෝ කවරහු ද? (ලකුණු 1 + 1 + 2 + 2 = 06)

## II කොටස

03. (අ) **'තාලුජ අක්ෂර'** ගැන කියැවෙන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

(ලකුණු 02)

(ආ) පහත සඳහන් අක්ෂර ප්‍රභේදවලට අයත් බාලාවතාර සූත්‍ර පාඨ ලියා දක්වන්න.

i) ඝෝෂාක්ෂර, ii) දීර්ඝ අක්ෂර,
iii) කණ්ඨජාක්ෂර, iv) අඝෝෂාක්ෂර, (ලකුණු 1 × 4 = 04)

(ඉ) පහත සූත්‍රවල අර්ථය ලියන්න.

i) අං ඉති නිග්ගහීතං
ii) ළන්තාඤ්ඤෙ ඝොසා
iii) අක්ඛරාපාදයො එකචත්තාළීසං (ලකුණු 2 × 3 = 06)

04. (අ) ආඛ්‍යාත ලක්ෂණ පැහැදිලි කරන බාලාවතාරයේ එන ගාථා පාඨය ලියා දක්වන්න.
(ලකුණු 02 යි)

(ආ) තද කළු අකුරින් මුද්‍රිත නාම පදයන් හි විභක්ති නම් කරන්න.

i) **බුද්ධො** ධම්මං භාසති.
ii) සිස්සො **ලෙඛනියා** ලිඛති.
iii) ඵලං **රුක්ඛම්හා** පතති.
iv) ගාමවාසී භික්ඛු **ආරාමෙ** වසති. (ලකුණු 04)

(ඉ) පහත සඳහන් ක්‍රියා පදවල ආඛ්‍යාත විභක්ති ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| i) යුඤ්ජථ | ii) ආසිං | iii) රක්ඛන්තු |
| iv) ජගාම | v) ආනෙය්‍ය | vi) පචෙථ |
| vii) යාචති | viii) අට්ඨාසි | ix) අභවිස්සා |
| x) කරිස්සාමි | xi) හොන්ති | xii) නික්කුජ්ජෙය්‍යුං |

(ලකුණු 06)

05. (අ) පාලි භාෂාවේ දක්වා ඇති ප්‍රධාන සන්ධි ප්‍රභේද හතර ලියා දක්වන්න.
(ලකුණු 02)

(ආ) පහත සඳහන් වාක්‍යවල ක්‍රියා විශේෂණ පද වෙන්කර දක්වන්න.
i) විඤ්ඤූ ඛිප්පං ධම්මං විජානාති.
ii) මයං සුඛෙන සයිතුං ලභිස්සාම.
iii) භටා අමච්චස්ස පුරතො ගච්ඡන්ති.
iv) භගවා නිබද්ධං භික්ඛූනං අප්පමාදෙන ඔවදි.
(ලකුණු 04)

(ඉ) පහත සඳහන් සන්ධි පද **විසන්ධි** කරන්න.

| | | |
|---|---|---|
| i) නොපෙති | ii) කිංසුධ | iii) ඡායාව |
| iv) වුත්‍යස්ස | v) යථරිව | vi) ස්වාගතං |
| vii) නයිමස්ස | viii) පච්චන්තං | ix) අවංසිරො |
| x) බුද්ධානසාසනං | xi) විදූනග්ගං | xii) එවමෙව |

(ලකුණු 06)

06. (අ) පහත සඳහන් සංඛ්‍යා **පාලියෙන්** ලියන්න.

i) 276
ii) 1932 (ලකුණු 02)

(ආ) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i) සීහො මිගෙ මාරෙති.
ii) අහං ඔදනං පචාමි.

iii) මයං පොත්ථකෙ පඨාම.

iv) කුමාරා අම්හෙ පහරන්ති. (ලකුණු 04)

(ඉ) පහත සඳහන් මාතෘකාවන්ගෙන් එකකට වාක්‍ය 06 කට නො අඩු පාලි රචනාවක් ලියන්න.

i) සාරිපුත්තත්ථෙරො,

ii) මම පරිවෙණං,

iii) ගජො,

iv) පුලත්ථිපුරං, (ලකුණු 06)

07. (අ) නිර්ධාරණාර්ථය යනු කුමක් දැයි හඳුන්වා නිදසුනක් සපයන්න.

(ලකුණු 02)

(ආ) පහත සඳහන් සමාස පද කුමන සමාසයට අයත් දැයි දක්වන්න.

| | |
|---|---|
| i) නීලුප්පලං | ii) ආගතසමණො |
| iii) උපනගරං | iv) මාතාපිතරො |
| v) තිභවා | vi) කාපුරිසො |
| vii) සුභික්ඛං | viii) මුනිසීහො |

(ලකුණු 04)

(ඉ) පහත සඳහන් තද්ධිතයන්හි අර්ථ ලියන්න.

| | | |
|---|---|---|
| i) වාසිට්ඨ | ii) සාතික | iii) මාගධ |
| iv) මෙධාවී | v) ආරොගය | vi) සතිමන්තු |

(ලකුණු 06)

08. (අ) පාලි ථූපවංසය රචනා කිරීමට ආරාධනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 02)

(ආ) පාලි වංසකථා හතරක නම් එහි කතුවරුන් සමග ලියා දක්වන්න.

(ලකුණු 04)

(ඉ) පහත දැක්වෙන හිස්තැන්වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා නැවත ලියන්න.

(සමාසො / එවාදිස්සරිපුබ්බො / අනුමති / අබ්‍යයීභාවො/ පුබ්බමධොඨිතමස්සරං/ සොසාසොසානං)

i) ........................................................................ පරිකප්පත්ථෙසු සත්තමී.

ii) ........................................................................ සරෙන වියොජයෙ.

iii) නාමානං ........................................................................ යුත්තත්ථො.

iv) වග්ගෙ ........................................................................ තතිය පඨමා.

v) උපසග්ගනිපාතපුබ්බකො ........................................................................

vi) ........................................................................ ච රස්සො.

(ලකුණු 06)